# Global indicator framework for the Sustainable Development Goals and targets of the 2030 Agenda for Sustainable Development*

Sustainable Development Goal indicators should be disaggregated, where relevant, by income, sex, age, race, ethnicity, migratory status, disability and geographic location, or other characteristics, in accordance with the Fundamental Principles of Official Statistics.[1]

| *Goals and targets (from the 2030 Agenda for Sustainable Development)* | *Indicators* | *UNSD Indicator Codes*[†] |
|---|---|---|
| **තිරසර සංවර්ධන අරමුණු 01-සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම** | | |
| 1.1 2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම. වර්තමාන තක්සේරු අනුව දිනකට ඩොලර් 1.25ට වඩා අඩුවෙන් ආදායම් ලබන අය අන්ත දිළිඳු කාණ්ඩයට අයත් වේ. | 1.1.1ස්ත්‍රී පුරුෂ භාවය ,වයස,සේවා නියුක්ති මට්ටම සහ භූගෝලීය පිහිටීම(නාගරික, ග්‍රාමීය) යන සාධකයන්ට අනුව අන්තර්ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහල ජනගහනයේ අනුපාතය | C010101 |
| | 1.2.1ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස අනුව ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත්වන ජනගහනයේ අනුපාතය | C010201 |
| | 1.2.2ජාතික අර්ථ දැක්වීම් වලට අනුව, දරිද්‍රතාවයේ සියලු මානයන්ට අදාළ තත්ත්වය තුල ජීවත් වන සියලු වයස් කාණ්ඩයන්ට අයත් පුරුෂ ස්ත්‍රී සහ ළමා ජනගහනයේ ප්‍රමාණය | C010202 |
| 1.3 පහළ මට්ටමේ අයද ඇතුළත්ව සියළුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම සහ 2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමගින් ආවරණය වී තිබීම | 1.3.1 සමාජ ආරක්ෂණ තල /ක්‍රම මඟින් ආවරණය සැපයෙන ජනගහනයේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව,ළමුන්, රැකියා වියුක්ති පුද්ගලයන්, වැඩිහිටියන්,ආබාධිත පුද්ගලයින්, ගර්භණී කාන්තාවන්, ළදරුවන් ,රැකියා ආශ්‍රිත අනතුරු වලට ගොදුරු වූවන් සහ දරිද්‍ර මෙන්ම අවදානම් කණ්ඩායම්හි ප්‍රමාණය | C010301 |
| 1.4 විශේෂයෙන්ම දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම | 1.4.1 මූලික සේවාවන් සහිත කුටුම්භයන්හි ජීවත්වන ජනගහනයේ ප්‍රමාණය | C010401 |
| | 1.4.2ස්ත්‍රී පුරුෂ භාවය සහ හිමිකම් මාදිලියට අනුව, නීත්‍යානුකූලව පිළිගත් ලිපි ලේඛන සහ සුරක්ෂිත ඉඩම් හිමිකම් සහිත මුළු වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය | C010402 |
| | 1.5.1 ජනගහනයේ ලක්ෂයකට ස්වභාවික ව්‍යසන හේතුවෙන් මියයන, අතුරුදහන් වන සහ ඍජුව බලපෑමට ලක්වන පුද්ගලයන් සංඛ්‍යාව | C200303 |

| | | |
|---|---|---|
| 1.5 2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන්නන්ගේ සහ අවදානමට ලක් විය හැකි තත්වයේ සිටින්නන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාලගුණික තත්වයන්ගෙන් ඇති වන්නාවූ හානිකර බලපෑම් ද ආර්ථික සමාජ සහ පරිසරමය වශයෙන් ඇතිවන්නාවූ හානි සහ ආපදාවලට නිරාවරණයවීම ද අඩු කිරීම | 1.5.2 ලෝක දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ස්වාභාවික ආපදා හේතුවෙන් සිදුවන සෘජු ආර්ථික හානිය | C010502 |
| | 1.5.3 . ආපදා අවදානම අවම කිරීම සඳහා වන සෙන්ඩායි කාර්ය රාමුවට (2015-2030) සමගාමීව ජාතික ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන් අනුගමනය කරන සහ ක්‍රියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව | C200304 |
| | 1.5.4ජාතික ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායනට සමගාමීව ප්‍රාදේශීය ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන් අනුගමනය කරන සහ ක්‍රියාවට නංවා ඇති පළාත් පාලන ආයතන ප්‍රමාණය | C200305 |
| 1.a විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් පවත්නා සියලුම ආකාරයේ දරිද්‍රතාවන් තුරන් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සහ විශ්වාසය තැබිය හැකි ක්‍රමවේද සම්පාදනය කිරීම සඳහා වැඩිදියුණු කරන ලද සංවර්ධන සහයෝගිතාව ඇතුළු විවිධ වූ මූලාශ්‍රයන් මගින් සම්පත් ලබා දීම කැපීපෙනෙන ආකාරයෙන් වර්ධනය කිරීම | 1.a.1 දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් සඳහා රජය විසින් වෙන් කර ඇති දේශීය ජනනය කරන ලද සම්පත් ප්‍රමාණය | C010a01 |
| | 1.a.2අත්‍යවශය සේවා (අධ්‍යාපන, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ )සඳහා වන රජයේ සමස්ත වියදම් ප්‍රමාණය | C010a02 |
| | 1.a.3 දළ දේශීය නිෂ්පාදනයේ අනුපාතයක් ලෙස දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් සඳහා සෘජුව වෙන් කර ඇති සමස්ත මූල්‍ය ප්‍රදානයන්ගේ සහ ණය නොවන මූලාශ්‍රයන් වල මුළු එකතුව | C010a03 |
| 1.b දරිද්‍රතාව තුරන් කිරීමේ ක්‍රියාවලීන් සඳහා ආයෝජනය කිරීම වේගවත් කිරීමට, දරිද්‍රතාවෙන් පෙළෙන අය සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටමේ ප්‍රතිපත්ති රාමු නිර්මාණය කිරීම | 1.b.1 ප්‍රතිලාභ ලැබීම සම්බන්ධයෙන් අසාධාරණයට ලක්වන කාන්තාවන්, දිළිඳු පුද්ගලයින් සහ අවදානම් කණ්ඩායම් වැනි අංශ සඳහා වන රජයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ප්‍රමාණය | C010b01 |

**තිරසර සංවර්ධන අරමුණු 02- සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම**

| | | |
|---|---|---|
| 2.1 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලකි වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පොෂණයෙන් යුත්, පුමාණවත් ආහාර වසර පුරා ලබාගැනීමට හැකි බව තහවුරු කිරීම | 2.1.1මන්දපෝෂණයේ ව්‍යාප්තිය | C020101 |
| | 2.1.2ආහාර අනාරක්ෂිතතා අත්විදීම් දර්ශකය පදනම් කර ගනිමින් ජනගහනය තුල මධ්‍යස්ථ සේ තිවූ ආහාර අනාරක්ෂිත භාවයේ ව්‍යාප්තිය | C020102 |
| 2.2 අවුරුදු පහට අඩු ළමුන් සම්බන්ධයෙන් මිටිවීම සහ ක්ෂය වීම පිළිබඳ අන්තර්ජාතික වශයෙන් එකඟතාවට පත්වූ ඉලක්ක 2025 වන විට ලඟාකරගැනීම ද ඇතුළත්ව 2030 වන විට සියලුම ආකාරයේ පවත්නා මන්දපොෂණ තත්වයන් තුරන් කිරීම සහ නවයොවුන් ගැහැණු ළමුන්ගේ, ගැබිණි මාතාවන්ගේ, කිරිදෙන මව්වරුන්ගේ සහ වයස්ගත පුද්ගලයින්ගේ පෝෂණ අවශ්‍යතාවන්ට විසඳුම් ලබා දීම | 2.2.1 වයස අවුරුදු 5 ට අඩු දරුවන් අතර කුරු භාවයේ ව්‍යාප්තිය(ලෝක සෞඛ්‍ය සංවිධානයේ ළමා වර්ධන ප්‍රමිතීන්ට අනුව, වයසට අදාළ උසෙහි මධ්‍යනය අගයෙන් <-2ක සම්මත අපගමනයක්) | C020201 |
| | 2.2.2 වයස අවුරුදු 5 ට අඩු ළමුන් අතර මාදිලිය අනුව (කෘෂවීම සහ ස්ථූලභාවය) දුෂ්පෝෂණයේ ව්‍යාප්තිය(ලෝක සෞඛ්‍ය සංවිධානයේ ළමා වර්ධන ප්‍රමිතීන්ට අනුව, වයසට අදාළ බරෙහි මධ්‍යනය අගයෙන් <+2 හෝ <-2 ක සම්මත අපගමනයක්) | C020202 |

| | | |
|---|---|---|
| 2.3 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ, ගොවි පවුල් සහ දීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබා දීම මගින් දෙගුණ කිරීම | 2.3.1 ගොවි/ගව පාලන /වනාන්තර ආශ්‍රිත කර්මාන්තයන් පන්තීන්හි විශාලත්වය අනුව, ශ්‍රම ඒකකයක් සඳහා නිෂ්පාදන පරිමාව | C020301 |
| | 2.3.2 ස්ත්‍රී පුරුෂ භාවය සහ ස්වදේශික මට්ටම අනුව සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ සාමාන්‍ය ආදායම | C020302 |
| 2.4 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ, කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාලගුණ තත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම | 2.4.1 ඵලදායි සහ තිරසාර කෘෂිකර්මය සිදුකරන කෘෂිකාර්මික බිම් ප්‍රමාණය | C020401 |
| 2.5 2020 වන විට බීජවල, වගාකරන ලද ශාකවල සහ ගොවිපළ සහ ගෘහාශ්‍රිත සතුන්ගේ ජානමය විවිධත්වය පවත්වාගෙන යාම සහ හොඳින් කළමනාකරණය කරන ලද සහ විවිධත්වයන්ගෙන් යුතු බීජ සහ ශාක බැංකු ජාතික කලාපීය සහ අන්තර්ජාතික මට්ටමින් පවත්වාගෙන යාම සහ අන්තර්ජාතික වශයෙන් එකඟ වූ ආකාරයට ජාන සම්පත් සහ පාරම්පරික දැනුම උපයෝගී කරගැනීම මගින් ලබාගන්නා වූ ප්‍රතිලාභවලට ප්‍රවේශ වීම සහ සමානව භුක්ති විඳීම තහවුරු කිරීම | 2.5.1 මධ්‍ය කාලීන හෝ දීර්ඝ කාලීන සංරක්ෂණ පහසුකම් යටතේ ආරක්ෂා කර තිබෙන  ආහාරමය හා කෘෂිකාර්මික වශයෙන් වැදගත් ශාක හා සත්ව ජාන සම්පත් සංඛ්‍යාව | C020501 |
| | 2.5.2 අවදානම්, අවදානම් නොවන සේ හඳුනා නොගත් වඳවීයාමේ අවදානම් මට්ටමක් සහිත යන කාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති දේශීය වරණයන්ගේ සංඛ්‍යාව | C020502 |
| 2.a විශේෂයෙන් අවම වශයෙන් දියුණු වූ රටවල් ඇතුළුව දියුණු වෙමින් පවත්නා රටවල කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා, ඉහල නංවන ලද අන්තර්ජාතික සහයෝගීතාවෙන් ග්‍රාමීය යටිතල පහසුකම්, කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන්, තාක්ෂණ සංවර්ධනය සහ ශාක සහ පශු සම්පත් ජාන බැංකු සඳහා සිදු කරන ආයෝජන වැඩි කිරීම | 2.a.1 රාජ්‍ය වියදම් සඳහා වන කෘෂිකාර්මික දිශානුගත දර්ශකය | C020a01 |
| | 2.a.2 කෘෂිකාර්මික අංශය සඳහා වන සමස්ත නිළධාරිමය ගලා යාම(නිළධාරි සංවර්ධන ආධාර සහ වෙනත් නිළධාරිමය ගලා ඒම) | C020a02 |
| 2.b  ලෝකයේ කෘෂිකාර්මික වෙළඳපොළේ සීමා කිරීම සහ සාවද්‍ය නියෝජනය වැළැක්වීම සහ නිවැරදි කිරීම සහ දෝහා සංවර්ධන න්‍යාය පත්‍රයේ එකඟතාවන් අනුව කටයුතු කරමින් සියලුම ආකාරයේ කෘෂිකාර්මික අපනයනයන් සඳහා වන සහනාධාර සහ සමාන බලපෑම ඇති සියලුම අපනයන ප්‍රයත්නයන් සමාන්තරගතව ඉවත් කිරීම | 2.b.1 කෘෂි අපනයන සහනාධාර | C020b02 |
| 2.c සීමාන්තික වශයෙන් ආහාර මිල උච්ඡාවචනය වීම වැළැකිවීමට ආහා සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළඳපොළවල් සහ ඒවායේ අතුරු නිෂපාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම | 2.c.1 ආහාර මිල අසමානතා දර්ශකය | C020c01 |

**තිරසර සංවර්ධන අරමුණු 03- නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම**

| | | |
|---|---|---|
| 3.1 2030 වන විට ලෝකයේ මාතෘ මරණ අනුපාතිකය සජීවී උපත් 100,000ට 70 දක්වා අඩු කිරීම | 3.1.1 මාතෘ මරණ අනුපාතය | C030101 |
| | 3.1.2 පුහුණුවළත් සෞඛ්‍ය කාර්ය මණ්ඩල සහාය ඇතිව අඩු ළදරු උපත් ප්‍රමාණය | C030102 |
| 3.2 සියලුම රටවල්වල නවජාත මරණ අනුපාතිකය සජීවී උපත් 1000ට 12 දක්වා සහ අවුරුදු පහට අඩු ළමා මරණ සජීවී උපත් 1000ට අවම වශයෙන් 25 දක්වා අඩු කිරීමේ ඉලක්කය ඇතිව 2030 වන විට අලුත උපන් සහ වයස අවුරුදු පහට අඩු ළමුන්ගේ වළක්වාගත හැකි මරණ තුරන් කිරීම | 3.2.1 වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ මරණ අනුපාතය | C030201 |
| | 3.2.2 බිළිඳු මරණ අනුපාතය | C030202 |
| 3.3 2030 වන විට ඒඩ්ස්, ක්ෂය රෝගය, මැලේරියා ඇතුළු නොතකා හැර ඇති සර්ම කලාපීය වසංගත, හෙපටයිටිස්, ජලය මගින් ඇතිවන රෝග සහ අනෙකුත් බෝවන රෝග තුරන් කිරීම | 3.3.1 ස්ත්‍රීපුරුෂ භාවය, වයස සහ ප්‍රධාන ජනගහනයන්ට අදාළව HIV ආසාධිත පුද්ගලයන් 1000කට අලුතින් HIV ආසාධිත පුද්ගලයන්ගේ සංඛ්‍යාව | C030301 |
| | 3.3.2 ජනගහනයෙන් පුද්ගලයන් ලක්ෂයකට සිටින ක්ෂය රෝගීන් සංඛ්‍යාව | C030302 |
| | 3.3.3 ජනගහනයේ පුද්ගලයන් 1000කට මැලේරියා රෝගීන් සංඛ්‍යාව | C030303 |
| | 3.3.4 ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින හෙපටයිටිස් B රෝගීන් සංඛ්‍යාව | C030304 |
| | 3.3.5 නොසලකා හරින ලද සර්ම කලාපීය රෝග සඳහා සෞඛ්‍යමය මැදිහත් වීමක් අවශ්‍ය පුද්ගලයන් සංඛ්‍යාව | C030305 |
| 3.4 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මගින් හා වළක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම | 3.4.1 හෘද නාල ආශ්‍රිත රෝග, පිළිකා, දියවැඩියාව හෝ නිදන්ගත ස්වසන රෝග හේතුවෙන් මියයන ප්‍රමාණය | C030401 |
| | 3.4.2 සියදිවිනසා ගැනීම් හේතුවෙන් මියයන ප්‍රමාණය | C030402 |
| 3.5 හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම | 3.5.1 මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් හටගන්නා ආබාධ තත්ත්වය සඳහා ප්‍රතිකාරමය පහසුකම් (ඖෂධමය, මනෝ විද්‍යාත්මක, පුනරුත්තාපනමය සහ රැකබලා ගැනීමේ සේවා)වල ව්‍යාප්තිය | C030501 |
| | 3.5.2 කැලැන්ඩර වර්ෂයක් තුල ( අවු 15 හෝ ඊට වැඩි) පුද්ගලයන් අතර ජාතික ඒක පුද්ගල මධ්‍යසාර පරිභෝජනයට අනුව අර්ථ දක්වන ලද හානිකර මධ්‍යසාර භාවිතය ශුද්ධ මධ්‍යසාර ලීටර් වලින් | C030502 |
| 3.6 2030 වන විට මහාමාර්ගවල සිදු වන අනතුරුවලින් සිදු වන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම | 3.6.1 මාර්ග අනතුරු හේතුවෙන් සිදුවන මරණ අනුපාතය | C030601 |
| 3.7 2030 වන විට පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ තොරතුරු සහ අධ්‍යාපනය ද ඇතුළත්ව ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය සත්කාරක සේවා සඳහා සියලුදෙනාට ම | 3.7.1 නවීන පවුල් සැලසුම් ක්‍රම උපයෝගීකර ගන්නා ප්‍රජනන වයසේ (අවු 15-49) ගත කරන කාන්තාවන්ගේ අනුපාතය | C030701 |

| | | |
|---|---|---|
| ප්‍රවේශ වීමේ අවස්ථා තහවුරු කිරීම සහ ප්‍රජනන සෞඛ්‍යය ජාතික ක්‍රමෝපායයන්ට සහ වැඩසටහන්වලට ඇතුළත් කිරීම | 3.7.2 නව යොවුන් කාන්තාවන් අතර දරු උපත් අනුපාතය (වයස 10-14 සහ 15-19 කාණ්ඩ ) කාන්තාවන් දහයකට | C030702 |
| 3.8 මූල්‍යමය අවදානයට පත්වීම සඳහා ආරක්ෂණය ද ඇතුළත්ව ආරක්ෂාකාරී, ඵලදායී, ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු වියදමකින් ලබා ගත හැකි ඖෂධ, එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියලු දෙනාටම ලබා ගත ඇකි වීම ඇතුළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි වීම | 3.8.1 අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා ආවරණය (සාමාන්‍ය ජනතාව සහ වඩාත් පහසුකම් අඩු ජනගහනයන් අතර ප්‍රජනන, මාතෘ, ළදරු, ළමා සෞඛ්‍ය බෝවන රෝග, බෝවන රෝග සහ සේවා පහසුකම් සඳහා වන සුලභතාවය ලෙස අර්ථ දැක්වේ | C030801 |
| | 3.8.2 සමස්ත පවුලේ වියදමෙන් නැතහොත් ආදායමෙන් වැඩි පංගුවක් සෞඛ්‍ය වෙනුවෙන් දරණ ජනගහනයේ ප්‍රමාණය. | C030802 |
| 3.9 2030 වන විට රසායනික, වාතය, ජලය සහ පස දූෂණය වීමත්, අපිරිසිදු වීමත් නිසා ඇති වන මරණ සහ රෝගී තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම | 3.9.1 ගෘහාශ්‍රිත නැතහොත් අවට පරිසරය දූෂණය වීම හේතුවෙන් මරණයට පත්වන අනුපාතය. | C030901 |
| | 3.9.2 අනාරක්ෂිත ජලය, අනාරක්ෂිත සනීපාරක්ෂක තත්ත්වයන් සහ පවිත්‍රතාවය අවම වීම (සියළු සේවාවන් සඳහා අනාරක්ෂිත ජලය, සනීපාරක්ෂණය සහ පවිත්‍රතාවයෙන් තොරවීම -WASH) | C030902 |
| | 3.9.3 අවබෝධයෙන් තොරව විෂ ශරීරගත වීම හේතුවෙන් සිදුවන මරණ අනුපාතය | C030903 |
| 3.a දුම් කොළ භාවිතය පාලනය කිරීම සඳහා වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වැඩ සැලැස්ම සියලුම රටවලට අදාල වන පරිදි ශක්තිමත් කිරීම සහ ක්‍රියාවට නැංවීම | 3.a.1 වයස අවු:15 සහ ඊට වැඩි පුද්ගයන් අතර පවත්නා දුම්කොළ භාවිතයේ වයසට අදාළ සම්මත සුලභතාවය | C030a01 |
| 3.b මූලික වශයෙන් සංවර්ධනය වෙමින් පවත්නා රටවලට බලපාන්නා වූ බෝ වන සහ බෝ නොවන රෝග සඳහා අවශ්‍ය එන්නත් හා ඖෂධ නිපදවීම සඳහා වූ පර්යේෂණ වලට සහාය ලබා දීම, අත්‍යාවශ්‍ය ඖෂධ සහ එන්නත් ලබා ගැනීමට අවස්ථාව සැලසීම, දෝහා ප්‍රකාශනයේ දැක්වෙන TRIPS එකඟතාවයට අනුව දියුණු වෙමින් පවතින රටවලට මහජන සෞඛ්‍ය ආරක්ෂාකර ගැනීම සම්බන්ධයෙන් පියවර ගැනීමේදී විශේශයෙන්ම සියලු දෙනාටම ඖෂධ ලබා ගැනීමට අවස්ථාව සැලසීම සඳහා වෙළදාම සම්බන්ධයෙන් වූ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිබඳව නම්‍යශීලීව කටයුතු කිරීමේ අයිතිවාසිකම පූර්ණ වශයෙන් යොදා ගැනීම | 3.b.1 තම ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන තුළට අන්තර්ගත සියළු එන්නත් මඟින් ආවරණය කෙරෙන ඉලක්කගත ජනගහනයේ ප්‍රමාණය | C030b01 |
| | 3.b.2 වෛද්‍ය පාර්යේෂණ සහ ප්‍රාථමික සෞඛ්‍ය අංශයන් සඳහා වන සමස්ත ශුද්ධ ආංශික සංවර්ධනය. | C030b02 |
| | 3.b.3 තිරසර පදනමින් පවත්වන සහ ලබාගතහැකි අදාළ අත්‍යවශ්‍ය ඖෂධ සමූහයකින් සමන්විත සෞඛ්‍ය පහසුකම් ප්‍රමාණය. | C030b03 |
| 3.c විශේශයෙන්ම අවම වශයෙන් දියුණු වූ රටවල සහ කුඩා දිවයින් රාජ්‍යයන්හි සෞඛ්‍ය සේවාවන් වෙනුවෙන් වෙන් කරන මුදල් සහ සෞඛ්‍ය කාර්යමණ්ඩල බඳවා ගැනීම සංවර්ධනය කිරීම, පුහුණු කිරීම සහ පවත්වාගෙන යාම සැලකිය යුතු මට්ටමකින් වැඩි කිරීම | 3.c.1 සෞඛ්‍ය සේවක ඝණත්වය සහ ව්‍යාප්තිය. | C030c01 |

| | | |
|---|---|---|
| 3.d විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ඇතුළුව සියලුම රටවල ජාතික මට්ටමේ සහ විශ්වීය මට්ටමේ සෞඛ්‍ය අවදානම් සඳහා පූර්ව දැනුම් දීමේ, අවදානම් අවම කිරීමේ සහ කළමනාකරණ කිරීමේ ධාරිතාවන් ශක්තිමත් කිරීම | 3.d.1 අන්තර්ජාතික සෞඛ්‍ය නියමයන් සඳහා වන ධාරිතාව සහ හදිසි සෞඛ්‍ය අවස්ථාවක් සඳහා වන සූදානම. | C030d01 |
| **තිරසර සංවර්ධන අරමුණු 04- පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම** | | |
| 4.1 2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකි වන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රථමික, සහ ද්විතීයික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම | 4.1.1 ස්ත්‍රී පුරුෂ භාවය අනුව, a. 2/3 ශ්‍රෙණිවල; 1. ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ සහ c. පහළ ද්වීතීක මට්ටම් වල ඉගෙනුම ලබන දරුවන් සහ යෞවනයන් අතර i. කියවීමට සහ ii. ගණිතමය කුසලතාවය සඳහා වන අවම මට්ටම සහිත අයගේ ප්‍රමාණය. | C040101 |
| 4.2 2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම | 4.2.1 ස්ත්‍රී පුරුෂ භාවය අනුව සෞඛ්‍යමය, ඉගෙනුම් සහ මනෝවිද්‍යාත්මක අංශයන්ගෙන් යහපත් සංවර්ධන මාර්ගයකට අවතීර්ණව සිටින වයස අවු: 5 ට අඩු ළමුන්ගේ ප්‍රමාණය. | C040201 |
| | 4.2.2 ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංවිධානාත්මක ඉගෙනුම් ක්‍රියාවලියට සම්බන්ධ වී සිටින අනුපාතය (ප්‍රාථමික පන්තියට ඇතුළත් කරගන්නා නිළ වයසට වඩා වසරකට පෙර) | C040202 |
| 4.3 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම | 4.3.1 ස්ත්‍රී පුරුෂ භාවය අනුව පූර්ව මාස 12 තුළ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ සහ වැඩිහිටියන්ගේ සහභාගීත්ව අනුපාතය | C040301 |
| 4.4 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම | 4.4.1 කුසලතාවයේ ආකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයෙන් යුක්ත යොවුන් සහ වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය. | C040401 |
| 4.5 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම, අධ්‍යාපනයේ සියලුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම සහ ආබාධිත පුද්ගලයින්ට, ස්වදේශිකයින්ට සහ අවදානමට ලක්විය හැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබාගැනීමට අවස්ථාව සැලසීම | 4.5.1 Parity indices (female/male, rural/urban, bottom/top wealth quintile and others such as disability status, indigenous peoples and conflict-affected, as data become available) for all education indicators on this list that can be disaggregated | C040501 |
| 4.6 2030 වන විට සියලුම තරුණ තරුණීන්, සහ කාන්තා, පිරිම, වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරිමේ හැකියාව ලබා සිටීම | 4.6.1 ස්ත්‍රී පුරුෂ භාවය අනුව කිසියම් වයස් කාණ්ඩයකට අදාළව අවම a. සාක්ෂරතා b. සංඛ්‍යාමය කාර්ය කුසලතාවක් අත්කරගෙන සිටින ජනගහනයේ ප්‍රමාණය | C040601 |
| 4.7 2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවන් ලබාගෙන සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායක වීම ඇතුළත් වේ | 4.7.1 (i) ගෝලීය පුරවැසිභාවය පිළිබඳ ඉගෙනුම ii. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ මානව හිමිකම් a. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් (b). විෂය මාලාවන්; © ගුරු අධ්‍යාපනය සහ (d) ශිෂ්‍ය ඇගයීම් යන සියළු මට්ටම් වලදී ප්‍රවාහානුගතව පැවතීම ඇතුලත් තිරසර සංවර්ධනය සඳහා වන ඉගෙනුම. | C040701 |

| | | |
|---|---|---|
| 4.a ළමුන්, ආබාධිත පුද්ගලයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ආකාරයට අධ්‍යාපන පහසුකම් ගොඩනැංවීම, වැඩිදියුණු කිරීම සහ සියලුම දෙනාට ආරක්ෂාකාරී, ප්‍රචණ්ඩත්වයෙන් තොර, සියලු දෙනා අන්තර්ගතකරණය වූ සහ ඵලදායී ඉගෙනීම් වාතාවරණයෙන් තහවුරු කර දීම | 4.a.1 Proportion of schools with access to (a) electricity; (b) the Internet for pedagogical purposes; (c) computers for pedagogical purposes; (d) adapted infrastructure and materials for students with disabilities; (e) basic drinking water; (f) single-sex basic sanitation facilities; and (g) basic handwashing facilities (as per the WASH indicator definitions) | C040a01 |
| 4.b 2020 වන විට, සංවර්ධනය වූ සහ අනෙකුත් සංවර්ධනය වෙමින් පවතින රටවලින් විශේෂයෙන් අවම වශයෙන් සංවර්ධනය වූ රටවල්, කුඩා ප්‍රමාණයේ සංවර්ධනය වෙමින් පවතින දිවයින් රාජ්‍යයන්, අප්‍රිකානු රටවල් හා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට උසස් අධ්‍යාපනය ලබාගැනීමට, වෘත්තීය පුහුණුව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, තාක්ෂණික, ඉංජිනේරු සහ විද්‍යාත්මක වැඩසටහන් සඳහා ලබා දෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි කිරීම | 4.b.1 Volume of official development assistance flows for scholarships by sector and type of study | C040b01 |
| 4.c 2030 වන විට අන්තර්ජාතික සහයෝගය තුළින් සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන්හි සහ අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල ගුණාත්මක වශයෙන් ඉහළ ගුරුවරුන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම | 4.c.1 Proportion of teachers in: (a) pre-primary; (b) primary; (c) lower secondary; and (d) upper secondary education who have received at least the minimum organized teacher training (e.g. pedagogical training) pre-service or in-service required for teaching at the relevant level in a given country | C040c01 |

**තිරසර සංවර්ධන අරමුණු 05- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම**

| | | |
|---|---|---|
| 5.1 කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම | 5.1.1 ස්ත්‍රී පුරුෂ භාවයට අදාලව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිසත් වන නෛතික රාමුවක් පවත්නේද නැද්ද යන්න | C050101 |
| 5.2 මානව කූට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුළත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම | 5.2.1 Proportion of ever-partnered women and girls aged 15 years and older subjected to physical, sexual or psychological violence by a current or former intimate partner in the previous 12 months, by form of violence and by age | C050201 |
| | 5.2.2 වයස සහ සිදු වූ ස්ථානය අනුව පසුගිය මාස 12 තුළදී හිතෛෂී සහකරුවා හැර සෙසු පුද්ගලයන් අතින් ලිංගික හිංසනයට ලක් වූ කාන්තාවන් සහ වයස අවු: 15 ට වැඩි ගැහැණු දරුවන්ගේ ප්‍රමාණය | C050202 |
| 5.3 ළමා විවාහයන්, බලහත්කාරයෙන් සිදුවන්නා වූ විවාහයන්, සහ කාන්තාවන්ගේ ලිංගික අවයව තුවාල කිරීම් වැනි සියලුම හානිකර භාවිතාවන් තුරන් කිරීම | 5.3.1 වයස අවු 20-24 වූ විවාහක හෝ වයස අවු 15 ට පෙර සහ වයස අවු 18 ට පෙර එක්ව වාසය කරන කාන්තාවන්ගේ ප්‍රමාණය. | C050301 |
| | 5.3.2 වයස අනුව, අවු 15-49 කාන්තා කණ්ඩායමේ ස්ත්‍රී ලිංගික සුන්නතියට ලක් කරන ලද කාන්තාවන්ගේ ප්‍රමාණය | C050302 |

| | | |
|---|---|---|
| 5.4 මහජන සේවාවන් යටිතල පහසුකම් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් සැපයීම තුළින් ගෙවීමක් සිදු නොකරන්නා වූ සේවාවන් සහ ගෘහාශ්‍රිත වැඩවල වටිනාකම හඳුනා ගැනීම, අගය කිරීම, සහ ජාතික වශයෙන් සුදුසු වන්නා වූ ආකාරයට නිවසේ සහ පවුලේ වගකීම් බෙදා ගැනීම ප්‍රවර්ධනය කිරීම | 5.4.1 ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ස්ථානය අනුව වැටුප් නොලබන ගෘහාශ්‍රිත හා රැකබලා ගැනීමේ කාර්යයන් වෙනුවෙන් වැය කරන කාල ප්‍රමාණය. | C050401 |
| 5.5 දේශපාලන, ආර්ථික, සහ සාමාන්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය සහ සමාන අවස්ථාවන් සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගි වීම තහවුරු කිරීම | 5.5.1 a. ජාතික පාර්ලිමේන්තුවේ b. පළාත් පාලන ආයතනයන්හී කාන්තාවන් විසින් දරණු ලබන ආසන ප්‍රමාණය. | C050501 |
| | 5.5.2 විධායක මට්ටමේ තනතුරු හොබවන කාන්තාවන්ගේ ප්‍රමාණය. | C050502 |
| 5.6 ජනගහනය සහ සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ වැඩසැලැස්මට අනුකූලව එකඟ වූ පරිදි සහ බීජිං ක්‍රියාකාරකම් සැලැස්ම සහ ඔවුන්ගේ සමාලෝචන සම්මන්ත්‍රණයේ ලේඛනවලට අනුකූලව ලිංගික, සහ ප්‍රජනන සෞඛ්‍යය, සහ අයිතිවාසිකම් සඳහා සියලු දෙනාටම ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම | 5.6.1 ලිංගික සම්බන්ධතා, උපත් පාලන ක්‍රම භාවිතය සහ ප්‍රජනන සෞඛ්‍ය රැකවරණය සම්බන්ධයෙන් ස්ව කැමැත්තෙන් තීරණ ගනු ලබන වයස අවු 15-49 කාණ්ඩයේ කන්තාවනගේ ප්‍රමාණය. | C050601 |
| | 5.6.2 වයස අවු 15 වට වැඩි කාන්තාවන් සහ පුරුෂයන් සඳහා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යාරක්ෂණය, තොරතුරු සහ අධ්‍යාපනය සඳහා පූර්ණ සහ සමාන ප්‍රවේශයන් සුරක්ෂිත කරන නීති සහ නියාමයන් සහිත රටවල් සංඛ්‍යාව | C050602 |
| 5.a කාන්තාවන්ට ආර්ථික අයිතිවාසිකම් ලබා දීම සඳහා වූ සංශෝධන සිදු කිරීමට කටයුතු කිරීම සහ දේශීය නීතිවලට අනුව ඉඩම් සහ වෙනත් ආකාරවල දේපල මූල්‍ය සේවාවන්, උරුමයන් සහ ස්වභාවික සම්පත්වල හිමිකාරිත්වය ලබා ගැනීම සහ පාලනය සිදු කිරීම සඳහා අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම | 5.a.1 හිමිකම් මාදිලිය අනුව (a) ස්ත්‍රී පුරුෂ භාවය අනුව කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධයෙන් හිමිකමක් නැතහොත් සුරක්ෂිත අයිතියක් සහිත සමස්ත කෘෂිකාර්මික ජනගහනයේ ප්‍රමාණය (b) කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ හිමිකරුවන් සහ අයිතිවාසිකම් දරන්නන් අතර කාන්තාවන්ගේ පංගුව | C050a01 |
| | 5.a.2 ඉඩම් හිමිකම් හෝ පාලනය සඳහා කාන්තාවන්ට සම අයිතිය තහවුරු කෙරෙන නෛතික රාමුවක් (බල පවත්නා නීතිය ඇතුළුව) සහිත රටවල් අනුපාතය | C050a02 |
| 5.b කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විශේෂයෙන්ම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ඇතුළත්ව තාක්ෂණය ලබාගැනීම සඳහා සාධනීය අවස්ථාවන් ලබා දීම | 5.b.1 ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජංගම දුරකථනයක් හිමි පුද්ගලයන්ගේ ප්‍රමාණය. | C050b01 |
| 5.c ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානත්වය සහ සියලුම මට්ටම්වල කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම සහ ශක්තිමත් කිරීම හා නීතිමය ලෙස බලාත්මක කිරීම | 5.c.1 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම හඳුනා ගැනීමට සහ රාජ්‍ය මුදල් වෙන් කිරීමක් සහිත ක්‍රමයන් පවත්නා රටවල් ප්‍රමාණය. | C050c01 |
| **තිරසර සංවර්ධන අරමුණු 06- සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම** | | |
| 6.1 2030 වන විට සියලු දෙනාට සමානාත්මතාවෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම | 6.1.1 සුරක්ෂිතව කළමණාකරණය කෙරෙන පානීය ජල සැපයුම් සේවා භාවිතා කරන ජනගහනයේ ප්‍රමාණය. | C060101 |

| | | |
|---|---|---|
| 6.2 2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත් ලෙස සහ සමානත්වයෙන් යුක්තව සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව ලබා ගැනීමට හැකි වීම සහ එළිමහනේ මළපහ කිරීම තුරන් කිරීම සහ විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ගැහැණු ළමුන්ගේ, සහ අවදානමට ලක්විය හැකි තත්වයේ සිටින පුද්ගලයින්ගේ විශේෂ අවශ්‍යතාවන් කෙරෙහි අවධානය යොමුකිරීම | 6.2.1 සබන් සහ ජලය සහිත අත් සේදීමේ පහසුකම ඇතුළුව ආරක්ෂිතව පාලනය වන සනීපාරාක්ෂක සේවා භාවිතා කරන ජනගහනයේ ප්‍රමාණය. | C060201 |
| 6.3 2030 වන විට ජල දූෂණය අඩු කරමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, හානිකර විෂ රසායනික සහ වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම සහ මුදා හැරීම තුරන් කිරීම, පිරිපහදු නොකරන ලද අපජලය මුදා හැරීම අඩු කිරීම සහ ජලය සැලකිය යුතු මට්ටමින් ප්‍රතිචක්‍රීයකරණය සහ ආරක්ෂාකාරීව නැවත භාවිතා කිරීම | 6.3.1 අප ජලය සුරක්ෂිත ලෙස ප්‍රතිකාර කෙරෙන ප්‍රමාණය. | C060301 |
| | 6.3.2 ගුණාත්මක භාවයෙන් යුක්ත ජලය සහිත ජලාශ ප්‍රමාණය. | C060302 |
| 6.4 2030 වන විට සියලුම කෂේත්‍රයන්හි කාර්යක්ෂමව ජලය භාවිතා කිරීම සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම, තිරසාර අන්දමින් ජලය ලබා තැනීම සහ සැපයීම, ජලය හිඟ කම මහැරවීම සඳහා සහ ජලය හිඟ කමින් පීඩා විදින ජනතාවගේ සංඛ්‍යාව ප්‍රාමාණික ලෙස අවම කිරීම | 6.4.1 ජල භාවිත කාර්යක්ෂමතාවයේ කාලානුරූපී වෙනස් වීම | C060401 |
| | 6.4.2 ජල භාවිත මට්ටම පවත්නා මිරිදිය මූලාශ්‍ර ප්‍රමාණයට අනුපාත වූ ජලය භාවිතයට ගන්නා ප්‍රමාණය. | C060402 |
| 6.5 2030 වන විට දේශ සීමා හරහා වූ සහයෝගය සුදුසු අන්දමින් උපයෝගී කරගනිමින් ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණයක් සියලුම මට්ටම් වල ක්‍රියාවට නැංවීම | 6.5.1 ඒකාබද්ධ ජල සම්පත් කළමණාකරනයක් සිදුවන මට්ටම (0-100) | C060501 |
| | 6.5.2 ජලය සහයෝගයෙන් භාවිතා කිරීම සඳහා වන ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් සහිත දේශ සීමා අතර විහිදුනු ජල නිම්න ප්‍රදේශයන්හි ප්‍රමාණය. | C060502 |
| 6.6 2020 වන විට කඳු, වන ගහන, තෙත් බිම්, ගංගාවන්, භූ ගත ජලය සහ විල් ඇතුලුව ජලය සම්බන්ධ ජීව පද්ධති ආරක්ෂා කිරීම සහ නැවත ස්ථාපිත කිරීම | 6.6.1 ජලාශ්‍රිත පරිසර පද්ධතින්හි භූමි ප්‍රමාණයේ කාලානුරූපීය වෙනස්වීම. | C060601 |
| 6.a 2030 වන විට ජලය එක්රැස් කිරීම, පිරිපහදු කිරීම, ජලය කාර්යක්ෂමව භාවිතා කිරීම, අප ජලය පිරිසිදු කිරීම, ප්‍රතිචක්‍රීකරණය, නැවත භාවිතා කිරීම සඳහා තාක්ෂණය ද ඇතුලත්ව ජලය හා සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ වැඩසටහන් හා ක්‍රියාකාරකම් සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ලබා දෙන අන්තර්ජාතික සහයෝගිතාව හා ධාරිතාවන් ශක්තිමත් කිරීමේ සහයෝගය ඉහළ නැංවීම | 6.a.1 රාජ්‍ය සම්බන්ධීකරණයෙන් යුක්ත වැය සැලැස්මේ කොටසක් ලෙස ජල හා සනීපාරක්ෂණය සහ සම්බන්ධව ක්ෂේත්‍ර සංවර්ධනයට සහය ලැබෙන ප්‍රමාණය. | C060a01 |
| 6.b ජලය හා සනීපාරක්ෂක කටයුතු කළමනාකරණයේදී ප්‍රාදේශීය ප්‍රජාවගේ සහභාගිත්වය දිරිගැන්වීම සහ සහය ලබා දීම | 6.b.1 ජල සහ සනීපාරක්ෂණ කළමනාකරණය සඳහා ප්‍රාදේශීය ජන කණ්ඩායම් සහභාගීකර ගැනීම සඳහා වන ස්ථාපිත සහ ක්‍රියාත්මක ප්‍රතිපත්ති සහිත පළාත් පාලන ඒකක ප්‍රමාණය. | C060b01 |

**තිරසර සංවර්ධන අරමුණු 07- සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්ාසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම**

| | | |
|---|---|---|
| 7.1 2030 වන විට සියලු දෙනාටම අඩු මිලකට ලබා ගත හැකි විශ්වාසදායී නවීන බල ශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකි බව තහවුරු කිරීම | 7.1.1 විදුලි සැපයුම සහිත ජනගහනයේ ප්‍රමාණය. | C070101 |
| | 7.1.2 මූලිකවම පවිත්‍ර ඉන්ධන සහ තාක්ෂණය මත රඳා පවත්නා ජනගහනයේ ප්‍රමාණය. | C070102 |
| 7.2 2030 වන විට ලෝක බලශක්ති මූලාශ්‍රයන්හි පුනර්ජනනීය බලශක්තීන්හි කොටස ඉහළ නැංවීම | 7.2.1 සමස්ත අවසන් බලශක්ති පරිභෝජනයෙන් පුනර්ජනනීය බලශක්ති පංගුව | C070201 |
| 7.3 2030 වන විට ලෝක බලශක්තී කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අනුපාතිකය දෙගුණයක් කිරීම | 7.3.1 ප්‍රාථමික බලශක්තිය සහ දළ දේශීය නිෂ්පාදනයට අදාළව ගණනය කරන බලශක්ති ඝණත්වය | C070301 |
| 7.a 2030 වන විට පිරිසිදු බලශක්ති පර්යේෂණ සහ තාක්ෂණ, පුනර්ජනණීය බලශක්තියද ඇතුලත්ව බලශක්ති කාර්යක්ශමතාව සහ උසස් සහ පිරිසිදු පොසිල ඉන්ධන තාක්ෂණය සහ බලශක්ති යටිතල පහසුකම් සහ පිරිසිදු බලශක්ති තාක්ෂණ සඳහා අන්තර්ජාතික සහයෝගිතාවය වැඩිදියුණු කිරීම | 7.a.1 පවිත්‍ර බලශක්තිය සම්බන්ධයෙන් වන පර්යේෂණ සහ සංවර්ධනය මෙන්ම ඒකාබද්ධ පද්ධතීන් ඇතුළු පුනර්ජනනීය බලශක්ති උත්පාදන සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙත ලැබෙන ජාත්‍යන්තර මූල්‍ය  ගලායාම් | C070a01 |
| 7.b 2030 වන විට විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල, කුඩා දිවයින් රාජ්‍යයන්හි සහ අනෙකුත් රටවල දේශ සීමාවන්ගෙන් ආවරණය වූ සංවර්ධනය වෙමින් පවත්නා රටවල්ද ඇතුලත්ව සියලුම සංවර්ධනය වන රටවලට ඔවුන්ගේ වැඩසටහන් සැලසුම්වලට අනුකූලව නවීන සහ තිරසර බලශක්ති සේවා සැපයීම සඳහා යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම සහ තාක්ෂණය වැඩිදියුණු කිරීම | 7.b.1 දළ දේශීය නිෂ්පාදනයේ සහ තිරසර සංවර්ධන සේවා සඳහා වන යටිතල පහසුකම් සහ තාක්ෂණය පිණිස වන මූල්‍ය හුවමාරුව පිණිස වන  ඍජු විදේශ ආයෝජන ප්‍රමාණයට අනුපාතව බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා වන ආයෝජන | C070b01 |
| **තිරසර සංවර්ධන අරමුණු 08- සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම** | | |
| 8.1 ජාතික තත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය පවත්වාගෙන යාම සහ විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් වසරකට අවම වශයෙන් වසරකට 7% ක දල ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් පවත්වාගෙන යාම | 8.1.1 සත්‍ය ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයේ වාර්ෂික වර්ධනය | C080101 |
| 8.2 විවිධාංගීකරණය, තාක්ෂණය ඉහළ නැංවීම සහ නවෝත්පාදන තුලින් සහ ඉහල වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ශේත්‍රය පිළිබඳ අවධානය යොමු කිරීම තුලින් ඉහල මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයක් ලබා ගැනීම | 8.2.1 සේවා නියුක්ත පුද්ලයෙකු සඳහා වන සත්‍ය දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය | C080201 |
| 8.3 ඵලදායී ක්‍රියාකාරකම් වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලී භාවයට සහය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තියෙන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරි ගැන්වීම | 8.3.1 ස්ත්‍රී පුරුෂභාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තයේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය | C080301 |
| 8.4 2030 දී, තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ දස අවුරුදු වැඩ සැලැස්මට අනුකූලව, ලෝක නිෂ්පාදනයේ සහ පරිභොජනයේදී සම්පත් [illegible] | 8.4.1 ද්‍රව්‍යමය පා සටහන, ඒක පුද්ගල ද්‍රව්‍යමය පා සටහන සහ දළ දේශීය නිෂ්පාදනයට අදාල ද්‍රව්‍යමය පා සටහන | C200202 |

| | | |
|---|---|---|
| වීම නැවැත්වීමට ක්‍රියාමාර්ග ගැනීම ප්‍රගතිශීලී ආකාරයට වර්ධනය කිරීම. මෙහිදී සංවර්ධනය වූ රටවල් විසින් පෙරමුණ ගනු ලැබේ | 8.4.2 දේශීය ද්‍රව්‍ය පරිභෝජනය, ඒක පුද්ගල දේශීය ද්‍රව්‍ය පරිභෝජනය, සහ දළ දේශීය නිෂ්පාදනයට අදාළව දේශීය ද්‍රව්‍ය පරිභෝජනය. | C200203 |
| 8.5 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම | 8.5.1 රැකියාව, වයස සහ අබාධිත සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තිකයන්ගේ පැයක සාමාන්‍ය ආදායම් ඉපැයීම. | C080501 |
| | 8.5.2 ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ අබාධිත සහිත පුද්ගලයන්ට අදාළව විරැකියා අනුපාතය. | C080502 |
| 8.6 2020 වන විට අධ්‍යාපනය නොලබන, පුහුණුවක් නොලබන, රැකියාවක් නොමැති යෞවනයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම | 8.6.1 අධ්‍යාපනය නොලබන, රැකියාවක නියුක්ත නොවන නැතහොත් පුහුණුවක් නොලබන යෞවනයන්ගේ (වයස 15-24) ප්‍රමාණය. | C080601 |
| 8.7 බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කූට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුලත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම | 8.7.1 ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස අනුව අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදාගෙන ඇති ප්‍රමාණය සහ සංඛ්‍යාව. | C080701 |
| 8.8 කම්කරු අයිතිවාසිකම් ආරක්ෂාකරගැනීම, විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුලු සංක්‍රමණිකයින් සහ අවධානම් සහගත රැකියාවල නිරත වූවන් ඇතුලත්ව වැඩ කරන සියලු දෙනා සඳහා ආරක්ෂාකාරී සහ ප්‍රවේසම් සහගත සේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය කිරීම | 8.8.1 ස්ත්‍රී පුරුෂ භාවය සහ සංක්‍රමණික තත්ත්වය අනුව මාරක සහ මාරක නොවන රැකියාව ආශ්‍රිත අනතුරු සිදුවීමේ අනුපාතයන් | C080801 |
| | 8.8.2 ස්ත්‍රී පුරුෂ භාවය සහ සංක්‍රමණික මට්ටම් අනුව, අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ලේඛන මූලාශ්‍ර ජාතික ව්‍යවස්ථාව පදනම්ව කම්කරු අයිතිවාසිකම් (රැස්වීමේ සහ සාමූහික කේවල් කිරීමේ නිදහස) සම්බන්ධයෙන් ඇති ජාතික අනුකූලතාවයේ මට්ටම | C080802 |
| 8.9 2030 වන විට දේශීය සංස්කෘතිය, නිෂ්පාදනය හා රැකියා අවස්ථාවන් ප්‍රවර්ධනය කරන්නා වූ තිරසර සංචාරක කර්මාන්ත පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම්කිරීම සහ ක්‍රියාත්මක කිරීම | 8.9.1 සමස්ථ දළ දේශීය නිෂ්පාදනයේ සහ වර්ධන වේගයේ පංගුවක් ලෙස සෘජු සංචාරක දළ දේශීය නිෂ්පාදනය | C080901 |
| | 8.9.2 Proportion of jobs in sustainable tourism industries out of total tourism jobs | C080902 |
| 8.10 සියලු දෙනාට බැංකු පහසුකම් රක්ෂණ, සහ මූල්‍ය සේවාවන් ලබා ගැනීමට ප්‍රවේශ විය හැකි පරිදි දේශීය මූල්‍ය ආයතන වල ධාරිතාවන් ශක්තිමත් කිරීම | 8.10.1 (a) වැඩිහිටියන් 10000 කට ඇති වාණිජ බැංකු ශාඛා ප්‍රමාණය සහ (b) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව (ATM) | C081001 |
| | 8.10.2 බැංකුවක හෝ වෙනත් මූල්‍ය ආයතනයක නැතහොත් ජංගම මූල්‍ය සේවා සැපයුම් සේවාවක ගිණුමක් ඇති වැඩිහිටියන් (අවුරුදු 15 හෝ ඊට වැඩි) ප්‍රමාණය. | C081002 |

| | | |
|---|---|---|
| 8.a විශේෂයෙන් අවම වශයෙන් සංවර්ධනය වූ රටවල්ද ඇතුලත්ව සංවර්ධනය වෙමින් පවත්නා රටවලට වෙළදාම සම්බන්ධයෙන් ලබා දෙන ආධාර වැඩි කිරීම. අවම වශයෙන් සංවර්ධනය වූ රටවලට වෙළදාම සම්බන්ධ තාක්ෂණික සහය ලබා දීම සඳහා වූ ඒකාබද්ධ වැඩ සැලැස්මට අනුකූලව කටයුතු කිරීම | 8.a.1 වෙළඳ වගකීම් සහ විසඳීම් සම්බන්ධයෙන් ආධාර සැපයීම | C080a01 |
| 8.b 2020 වන විට තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබා දීම සඳහා ජගත් මට්ටමින් ක්‍රමෝපායක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම හා අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ජගත් රැකියා සම්මුතිය ක්‍රියාවට නැංවීම | 8.b.1 වෙන් වූ ක්‍රමෝපායක් නැතහොත් ජාතික සේවා නියුක්ත ක්‍රමෝපායේ කොටසක් ලෙස සංවර්ධිත සහ | C080b01 |

**තිරසර සංවර්ධන අරමුණු 09- සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම**

| | | |
|---|---|---|
| 9.1 ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 9.1.1 වසර පුරා භාවිත කළ හැකි මාර්ගයක සිට කි.මී. 2ක දුර ප්‍රමාණයක් තුළ ජීවත් වන ග්‍රාමීය ජන ගහනයේ ප්‍රමාණය | C090101 |
| | 9.1.2 මගීන් සහ භාණ්ඩ ප්‍රමාණය, ප්‍රවාහන මාධ්‍යය අනුව | C090102 |
| 9.2 සියලු දෙනාම අන්තර්ගත වන්නා වූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්වයන්ට අනුකූල රැකියාවන් සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට | 9.2.1 දළ දේශීය නිෂ්පාදනය සහ ඒක පුද්ගල ආදායමේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අගය එකතු කිරීම් | C090201 |
| | 9.2.2 සමස්ථ සේවා නියුක්තියේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අංශයේ සේවා නියුක්තිය | C090202 |
| 9.3 විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල කුඩා පරිමාණ කර්මාන්ත සහ වෙනත් ව්‍යවසායන් සඳහා මූල්‍ය සේවාවන්, ණය ලබාගැනීමේ ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීම සහ එම ව්‍යවසායන් වටිනාකම් දාමයන්ට සහ වෙළඳපොළ දාමයන්ට ඒකාබද්ධ කිරීම | 9.3.1 සමස්ථ නිෂ්පාදන අගය එකතු කිරීම් වල පංගුවක් ලෙස කුඩා පරිමාණ නිෂ්පාදන ප්‍රමාණය | C090301 |
| | 9.3.2 ණය හෝ ණය මාර්ග සහිත කුඩා පරිමාණ කර්මාන්ත ප්‍රමාණය | C090302 |
| 9.4 2030 වන විට යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත තිරසර කිරීම සඳහා නව තාක්ෂණය මගින් සංවර්ධනය කිරීම, කර්මාන්ත ක්‍රියාවලියේදී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිතා කිරීම වැඩිදියුණු කිරීම සහ පිරිසිදු සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණයන් උපයෝගී කර ගැනීමට සියලුම රටවල් ඔවුන්ට පවත්නා ධාරිතාවන් අනුව මේ සම්බන්ධයෙන් පියවර ගැනීම | 9.4.1 අගය එකතු කිරීම් ඒකකයක් සඳහා විමෝචනය වන කාබන් ඩයොක්සයිඩ් වායු ප්‍රමාණය | C090401 |
| 9.5 විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ඇතුළු සියලු රටවල කර්මාන්ත අංශයන්හි තාක්ෂණික ධාරිතාවන් ඉහළ නැංවීම. 2030 වන විට නවෝත්පාදනය දිරිගැන්වීම සහ | 9.5.1 දළ දේශීය නිෂ්පාදනයේ අනුපාතයක් ලෙස පර්යේෂණ හා සංවර්ධන පිරිවැය | C090501 |

| | | |
|---|---|---|
| පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි නියුතු ශ්‍රමිකයන් සංඛ්‍යාව ජනගහනයට සාපේක්ෂව ප්‍රමානිකව ඉහළ නැංවීම සහ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වූ වියදම් වැඩි කිරීම | 9.5.2 ජනගහනයේ මිලියනයක් සඳහා සිටින පර්යේෂණයක් (පූර්ණ කාලීන හෝ සමාන) සංඛ්‍යාව | C090502 |
| 9.a අප්‍රිකානු රටවලට, අවම වශයෙන් සංවර්ධනය වූ රටවලට, අනෙකුත් රටවලින් වට වූ රටවලට සහ සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යවලට මූල්‍යමය, තාක්ෂණවේදී, සහ තාක්ෂණික සහයෝගය ලබාදීම මගින් සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ඔරොත්තු දෙන ආකාරයෙන් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම | 9.a.1 යටිතල පහසුකම් සඳහා වන සමස්ථ නිළ ජාත්‍යන්තර සහාය (නිළ සංවර්ධන ආධාර සහ වෙනත් නිළ වශයෙන් ලැබෙන සැපයුම්) | C090a01 |
| 9.b සංවර්ධනය වෙමින් පවත්නා රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය, පර්යේෂණ සහ නවෝත්පාදනය සඳහා සහාය ලබාදීම, එකිනෙකා අතර කර්මාන්ත විවිධාංගීකරණය සහ නිෂ්පාදනයන් සඳහා වටිනාකම එකතු කිරීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති වාතාවරණයක් සැකසීම | 9.b.1 සමස්ථ අගය එකතු කිරීම් වලින් මධ්‍ය හා ඉහල තාක්ෂණික කර්මාන්ත අගය එකතු කිරීම් ආපාතය ආවරණය වන ජනගහන අනුපාතය | C090b01 |
| 9.c 2020 වන විට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයට ප්‍රවේශවීමේ හැකියාව කැපී පෙනෙන ආකාරයට වර්ධනය කිරීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවලට අඩු මිලට සහ සැමටම අන්තර්ජාලය වෙත ප්‍රවේශවීමේ අවස්ථාව සැලසීමට ප්‍රයත්න දැරීම | 9.c.1 ජංගම දුරකථන හා තාක්ෂණයෙන් ආවරණය වන ජනගහන අනුපාතය | C090c01 |
| **තිරසර සංවර්ධන අරමුණු 10- රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම** | | |
| 10.1 2030 වන විට ජනගහනයේ පහළ මට්ටමේ සිටින 40% හි ගේ ආදායම් වර්ධනය ජාතික මට්ටමේ සාමාන්‍ය අගයට වඩා වැඩියෙන් ප්‍රගතශීලී ලෙස වර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම | 10.1.1 ජනගහනයේ පහලට 40% සහ සමස්ථ ජනගහනය අතර ගෙදරදොර වියදම් හෝ ඒක පුද්ගල ආදායමේ වර්ධන වේගය | C100101 |
| 10.2 2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිතබව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්වයන් පිලිබඳව තැකීමකින් තොරව සියලු දෙනාගේ සමාජ ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම | 10.2.1 ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධිත තත්ත්වය හා සාධකයන් අනුව මධ්‍ය ආදායමෙන් 50%කට වඩා පහලින් ජීවත් වන ජනගහනයේ ප්‍රමාණය | C100201 |
| 10.3 ප්‍රතිලාභ බෙදීයාමේදී සමාන අවස්ථාවන් පැවතීම තහවුරු කිරීම, පවත්නා අසමානතාවන් අවම කිරීම සහ වෙනස්කොට සැලකීමට තුඩුදෙන්නා වූ නීති, ප්‍රතිපත්ති, සහ භාවිතාවන් ඉවත් කිරීම සහ මේ සම්බන්ධයෙන් සුදුසු නීති ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ගැනීම | 10.3.1 ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ වෙනස් කොට සැලකීම යන පදනම යටතේ තහනම් කොට ඇති වෙනස්කම් සහ හංසනයන්ට තමන් පසුගිය මාස 12 ක කාලය තුළදී ගොදුරු වූ බවට පුද්ගලිකව හැඟෙන බවට වාර්තා කරන ජනගහනයේ ප්‍රමාණය | C200204 |
| 10.4 විශේෂයෙන්ම මූල්‍ය, වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති භාවිතයට ගැනීම සහ ප්‍රගතිශීලී ලෙස සමානත්වය ළඟා කර ගැනීම | 10.4.1 වැටුප් සහ සමාජ ආරක්ෂණ හුවමාරු වලින් සමන්විත දළ දේශීය නිෂ්පාදනයේ ශ්‍රම පංගුව | C100401 |
| 10.5 නීතිමය තත්වයන් වර්ධනය කිරීම, ලෝක මූල්‍ය වෙළඳ පොළවල් සහ ආයතන අධීක්ෂණය කිරීම, සහ මෙවැනි රෙගුලාසි ක්‍රියාවට නැංවීම ශක්තිමත් කිරීම | 10.5.1 මූල්‍ය සංවේදිතා දර්ශක | C100501 |

| | | |
|---|---|---|
| 10.6 ජගත් මට්ටමේ අන්තර්ජාතික ආර්ථික සහ මූල්‍ය ආයතන වඩාත් ඵලදායී, විශ්වාසවන්ත, වගවීමෙන් යුත් සහ නීතිමයභාවයකින් යුත් ආයතන බවට පත් කිරීම සඳහා ඒවා සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී සංවර්ධනය වෙමින් පවත්නා රටවල නියෝජනය කාර්යක්ෂමව තහවුරු කිරීම | 10.6.1 ජාත්‍යන්තර සංවිධානයන්හි සාමාජිකත්වය දරණ සහ ඡන්ද බලය හිමි සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ප්‍රමාණය | C200205 |
| 10.7 හොඳින් කළමනාකරණය කරන ලද සහ සැලසුම් කරන ලද ආකාරයට සංක්‍රමණ කටයුතු ක්‍රියාවට නැංවීම ද ඇතුළත්ව වගවීමෙන් යුක්තව, මනාව සංවිධානගතව, ආරක්ෂාකාරීව ජනතාවට ඔබ මොබ යාමේ සහ සංක්‍රමණය වීමේ පහසුකම් සැලසීම | 10.7.1 සේවයේ නියුතු රට තුළදී උපයන ආදායමේ පංගුවක් ලෙස සේවා යෝජකයා විසින් දරණු ලබන බදවා ගැනීමේ පිරිවැය | C100701 |
| | 10.7.2 හොඳින් කළමනාකරණය වන සංක්‍රමණික ප්‍රතිපත්ති කියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව | C100702 |
| 10.a විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල් ද ඇතුළත්ව ලෝක වෙළඳ සංවිධනයේ එකඟතාවන්ට අනුකූලව සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සඳහා විශේෂ සහ වෙනස් ආකාරයට සලකන්නා වූ මූලධර්මයන් ක්‍රියාවට නැංවීම | 10.a.1 ආනයනය සඳහා පනවා ඇති තීරු බඳු වලට අනුපාතිකව ඌන සංවර්ධිත රටවලින් සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවලින් තීරු බදු රහිත අපනයනයන්ගේ ප්‍රමාණය | C100a01 |
| 10.b වැඩිම අවශ්‍යතාවක් පවත්නා අවම වශයෙන් සංවර්ධනය වූ රටවල්, අප්‍රිකානු රටවල්, සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යයන්, සහ වෙනත් රටවලින් ආවරණය වී පවත්නා රටවල් සඳහා ඔවුන්ගේ ජාතික සැලසුම් සහ වැඩසටහන්වලට අනුකූලව විදේශ සෘජු ආයෝජනයන්ද ඇතුළත්ව නිල සංවර්ධන සහායන් සහ මූල්‍ය ප්‍රවාහයන් දිරිගැන්වීම | 10.b.1 ප්‍රතිලාභී හෝ දායක රට සැපයුම් මාදිලිය ( නිළ සංවර්ධන ආධාර, සෘජු විදෙස් ආයෝජන හෝ වෙනත් සැපයුම්) අනුව සංවර්ධනය සඳහා වන සමස්ථ සම්පත් ගලනය | C100b01 |
| 10.c 2030 වන විට සංක්‍රමණිකයින් විසින් එවනු ලබන මුදල් ප්‍රේෂණ සඳහා හුවමාරු පිරිවැය 3% ට වඩා අඩු කිරීම සහ 5% ට වඩා වැඩයෙන් අය කරනු ලබන ප්‍රේෂණ මාර්ගයන් ඉවත් කිරීම | 10.c.1ප්‍රේෂණ වියදම, ප්‍රේෂණ ප්‍රමාණයේ පංගුවක් ලෙස | C100c01 |

**තිරසර සංවර්ධන අරමුණු 11- නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම**

| | | |
|---|---|---|
| 11.1 2030 වන විට සියලුම දෙනාට ප්‍රමානවත් ආරක්ෂාකාරී සහ අඩු මිළට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම | 11.1.1 පැල්පත්, අවිධිමත් ජනාවාස හෝ ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත් වන නාගරික ජනගහනයේ ප්‍රමාණය | C110101 |
| 11.2 විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින්, සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මගින් 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබා ගත හැකි ප්‍රවේශවිය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම | 11.2.1 ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධ සහිත අය යන සාධක මත පොදු ප්‍රවාහන පහසුකම් පහසුවෙන් ලබාගත හැකි | C110201 |
| 11.a 2030 වන විට සියලුදෙනා අන්තර්කරණය වූ සහ තිරසර නාගරීකරණය | 11.3.1 භූමි පරිභෝජන වේගය සහ ජනගහන වර්ධන වේගය අතර අනුපාතය | C110301 |

| | | |
|---|---|---|
| වැඩිදියුණු කරම සහ සියලුම රටවල සහභාගීත්ව, ඒකාබද්ධ සහ තිරසර මානව ජනාවාස සැලසුම් කිරීම, සහ කළමනාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩිදියුණු කිරීම | 11.3.2 විධිමත් සහ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ක්‍රියාවට නැංවෙන නගර සැලසුම් සහ කළමනාකරණ ක්‍රියාවලියක් තුල සිවිල් සමාජය සඳහා ඍජුව සහභාගී විය හැකි ව්‍යුහයක් සහිත නගර ප්‍රමාණය | C110302 |
| 11.b ලෝකයේ ස්වාභාවික සහ සංස්කෘතික උරුමයන් රැකගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම | 11.4.1 උරුමයේ ආකාරය (සංස්කෘතික, ස්වාභාවික, මිශ්‍ර ලෝක උරුම මධ්‍යස්ථාන යටතේ), පරිපාලන මට්ටම (ජාතික, ප්‍රාදේශීය, පළාත් පාලන/නාගරික), වියදම් ආකාරය(මෙහෙයුම් වියදම්/ආයෝජන) සහ පුද්ගලික මූල්‍ය යෙදවුම්(පුද්ගලික, ලාබ නොලැබෙන අංශයේ සහ අනුග්‍රාහක) අනුව සියලු සංස්කෘතික සහ ස්වාභාවික උරුමයන් රැකගැනීම, ආරක්ෂාව සහ සංරක්ෂණය වෙනුවෙන් සිදුකරන සමස්ථ ඒක පුද්ගල වියදම (රාජ්‍ය හා පුද්ගලික) | C110401 |
| 11.c 2030 වන විට දරිද්‍රතාවෙහි සහ අවදානමට පත්විය හැකි තත්වයන්හි සිටින පුද්ගලයින් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් ජලය මගින් සිදුවන්නා වූ විනාශයන් ද ඇතුළු ආපදාවලින් ලෝකයේ දළ දේශීය නිෂ්පාදිතයට සිදුවන ඍජු ආර්ථික හානිය සැලකිය යුතු ලෙස අඩු කිරීම සහ මෙමගින් බලපෑමට හා මරණයට පත් වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස අඩු කිරීම | 11.5.1 පුද්ගලයන් 100,000ට හදිසි ආපදා හේතුවෙන් සිදුව ඇති මරණ සංඛ්‍යාව, අතුරුදන් සංඛ්‍යාව සහ ඍජුව බලපෑමට ලක්ව ඇති සංඛ්‍යාව | C200303 |
| | 11.5.2 ආපදා තත්ත්ව හේතුවෙන් ගෝලීය දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ඍජු ආර්ථික හානිය, අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වලට සිදු වූ හානිය සහ මූලික සේවා වලට සිදුවූ බාධාවන් | C110502 |
| 11.6 2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත්ව නගර නිසා සිදු වන ඒක පුද්ගල අහිතකර පරිසර බලපෑම අඩු කිරීම | 11.6.1 නගරවල ජනනය වන මුළු නාගරික ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය අතරින් නිතිපතා එකතු කෙරෙන සහ නිසි පරිදි බැහැර කෙරෙන නාගරික ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය | C110601 |
| | 11.6.2 නගරවල පවත්නා (ජනගහනහරිත) ක්ෂුද්‍ර අංශුමය පදාර්ථයන්හි වාර්ෂික මධ්‍යන්‍ය මට්ටම (උදා: PM 2.5 සහ PM 10) | C110602 |
| 11.7 2030 වන විට විශේෂයෙන්ම කාන්තාවන්ට සහ ළමුන්ට, වයස්ගත පුද්ගලයින්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ආරක්ෂාකාරී වන, සියලු දෙනා අන්තර්ගත වූ, සහ පහසුවෙන් පිවිසිය හැකි පොදු හරිත අවකාශයන් ලබා දීම | 11.7.1 ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන කරුණු අනුව නගරවල මහජන භාවිතයට ඇති විවෘත අවකාශ අතරින් ගොඩනගන ලද ප්‍රදේශයන්හි සාමාන්‍ය පංගුව | C110701 |
| | 11.7.2 පසුගිය මාස 12 ක කාලය තුල ස්ත්‍රී පුරුෂ භාවය වයස ආභාධිත ලිංගික හිංසනයට ගොදුරු වූ ලුද්ගලයන්ගේ ප්‍රමාණය | C110702 |
| 11.8 ජාතික සහ කලාපීය සංවර්ධන සැලසුම් ශක්තිමත් කිරීම මගින් නාගරික, උප නාගරික, සහ ග්‍රාමීය ප්‍රදේශවල ධනාත්මක ආර්ථික සමාජයීය සහ පරිසරාත්මක සම්බන්ධතාවලට අභාය දැක්වීම | 11.a.1 නගර ප්‍රමානය අනුව ජවලභව ප්‍රක්ෂේපණයන් සහ සම්පත අවශ්‍යතාවයන් ඒකාබද්ධ කරලනිමින් සාදුකරන සහ ප්‍රදේශීය සංවර්ධන සැලසුම් ක්‍රායාත්භක කරුණු ලබන නගරයන්හි ජීවත්වන ජනගහනයේ ප්‍රමාණය | C110a01 |
| 11.9 2020 වන විට සියලුම ආකාරයේ සියලුම මට්ටම්වල ආපදා අවදානම් අවම කිරීම පිළිබඳව සෙන්ඩියල් වැඩසැලැස්මේ ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාවට නංවන, සියලු දෙනා අන්තර්ගත වූ, සම්පත් කාර්යක්ෂමතාවෙන් භාවිතා කරන, | 11.b.1 2015-2030 ආපදා අවධානම අවම කිරීම සඳහා වන සෙන්ඩායි කාර්ය රාමුවට අනුකූලව ජාතික අවධානම් අවම කිරීමේ ක්‍රෙමෝපායන් ක්‍රියාක්මක කරන රටවල් සංඛ්‍යාව | C200304 |

| | | |
|---|---|---|
| තාලගුණික වෙනස්කම් අවම කිරීමේ සහ ඒ අනුව හැඩගැසෙන, ආපදාවලට ඔරොත්තු දෙන ආකාරයේ නගර සහ මානව ජනාවාසවල ප්‍රමාණය සැලකිය යුතු මට්ටමෙන් ඉහළ නැංවීම | 11.b.2 ජාතිකආපදා අවම කිරීමේ ක්‍රෙමා්පායන්ට සමාන්තරන ප්‍රාෙද්ශීය ආපදා අවම කිරීමේ ක්‍රෙමා්පායන් යොදාගෙන සහ ක්‍රියාවට නංවා ඇති පළාත් පාලන ආයතන ප්‍රමාණය | C200305 |
| 11.10 අවම වශයෙන් සංවර්ධනය වූ රටවලට දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කරගෙන තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන ගොඩනැගිලි සෑදීමට අවශ්‍ය මූල්‍ය සහ තාක්ෂණික සහාය ලබාදීම | 11.c.1 ඌන සංවර්ධිත රටවලට දෙනු ලබන මූල්‍ය අනුග්‍රහයෙන් දේශීය අමුද්‍රව්‍ය යොදාගනිමින් තිරසර වෙනස්කල නොහැකි සහ සම්පත් කාර්යක්ෂම ලෙස යොදා ගැනීමෙන් සාදන සහ අංගෝපාංග එකතු කරනු ලබන ඉදිකිරීම් සඳහා වෙන් නෙරෙන ප්‍රමාණය | C110c01 |
| **තිරසර සංවර්ධන අරමුණු 12- තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික තිරිම** | | |
| 12.1 සංවර්ධනය වෙමින පවතින රටවල සංවර්ධනය සහ ධාරිතාවන් පිළිබඳව සැලකිලිමත් වෙමින් තිරසර පාරිභෝජනය සහ නිෂ්පාදනය සම්බන්ධයෙන් වන දස අවුරුදු වැඩසැලැස්ම සංවර්ධනය වූ රටවල ප්‍රධානත්වයෙන් සියලුම රටවල් විසින් ක්‍රියාවට නැංවීම | 12.1.1 තිරසර පරිභෝජන සහ නිෂ්පාදන ජාතික ක්‍රියාකාරි සැලසුම් ජාතික ප්‍රතිපත්තීන් තුල ප්‍රමානානුගත ප්‍රමුඛතා ලෙස හෝ ඉලක්ක ලෙසින් ක්‍රියාත්මක කරන රටවල් සංඛ්‍යාව | C120101 |
| 12.2 2030 වන විට ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීම සහ කාර්යක්ෂව භාවිතා කිරීම වෙත ළඟා වීම | 12.2.1 ද්‍රව්‍යමය පා සටහන,ඒක පුද්ගල ද්‍රව්‍යමය පා සටහන සහ දළ දේශීය නිෂ්පාදනයට අනුව ද්‍රව්‍යමය පා සටහන | C200202 |
| | 12.2.2 දේශීය භාණ්ඩ පරිභෝජනය, ඒක පුද්ගල දේශීය භාණ්ඩ පරිභෝජනය සහ දළ දේශීය නිෂ්පාදනයට අනුව දේශීය ද්‍රව්‍ය පරිභෝජනය | C200203 |
| 12.3 2030 වන විට සිල්ලර සහ පාරිභෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ පශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැපයුම් දාමයන්හි සිදුවන්නා වූ අපතේ යාම අවම කිරීම | 12.3.1 ලෝක ආහාර හානි දර්ශකය | C120301 |
| 12.4 2020 වන විට එකඟතාවට පත් වී ඇති අන්තර්ජාතික වැඩසැලැස්මට අනුකූලව පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය හා සියලුම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ක්‍රියාවට නැංවීම සහ එමගින් මානව සෞඛ්‍යයට සහ පරිසරයට සිදුවන්නා වූ අහිතකර බලපෑම අවම කිරීම සඳහා වාතයට, ජලයට සහ පසට ඒවා මුදා හැරීම අවම කිරීම | 12.4.1 හානිකර අපද්‍රව්‍ය සහ සෙසු රසායනිකයන් පිළිබඳ ජාත්‍යන්තර බහු පාර් ශවීය ගිවිසුම් සම්බන්ධයෙන් එක් එක් ගිවිසුමක් මඟින් අදාළ වන පරිදි තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා වන වගකීම් සහ බැඳීම් සඳහා සම්බන්ධ වී සිටින පාර් ශවකරුවන් සංඛ්‍යාව | C120401 |
| | 12.4.2 ඒක පුද්ගල හානිකර අපද්‍රව්‍ය ජනනය සහ ප්‍රතිකාර ක්‍රමයේ ආකාරය අනුව හානිකර අපද්‍රව්‍ය ප්‍රතිකාර කරන ප්‍රමාණය | C120402 |
| 12.5 2030 වන විට අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම, අඩුකිරීම, ප්‍රතිචක්‍රීයකරණය සහ ඒවා නැවත භාවිතා කිරීම මගින් අඩු කිරීම | 12.5.1 ජාතික ප්‍රතිචක්‍රීකරණ වේගය, ප්‍රතිචක්‍රීකරණ ද්‍රව්‍ය ටොන් ගණන | C120501 |
| 12.6 විශේෂයෙන්ම විශාල සහ ජාත්‍යන්තර සමාගම් ඇතුළු සියලු සමාගම්ව තිරසර භාවිතයෙන් යොදා ගැනීමට පෙළඹවීම සහ ඔවුන්ගේ වාර්තා කිරීමේ චක්‍රයට තිරසර තොරතුරු ඒකාබද්ධ කිරීම දිරි ගැන්වීම | 12.6.1 තිරසාරමය වාර් තා ප්‍රකාශයට පත් කරන සමාගම් සංඛ්‍යාව | C120601 |
| 12.7 ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවන් අනුව තිරසාර මහජන ප්‍රතිසම්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම | 12.7.1 තිරසර රාජ්‍යමය මිලදී ගැනීම් ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව | C120701 |

| | | |
|---|---|---|
| 12.8 2030 වන විට සියලුම ප්‍රදේශවල සිටින සියලුම දෙනාට තිරසාර සංවර්ධනය හා ස්වභාවධර්මය සමග සුසංයෝගයෙන් යුත් ජීවන රටාවන් ගත කිරීම පිළිබඳව දැනුවත්භාවයක් සහ ඊට අදාළ තොරතුරු ලැබී තිබීම තහවුරු කිරීම | 12.8.1 (a) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති (b) විෂය මාලා (c) ගුරු අධ්‍යාපනය සහ (d) ශිෂ්‍ය ඇගයීම්, කෙතරම් දුරට (i) ගෝලය පුරවැසිභාවය පිළිබඳ අධ්‍යාපනය සහ (ii) තිරසර සංවර්ධනය (දේශගුණික විපර් යාස පිළිබඳ අධ්‍යාපනය ද ඇතුළත්ව) යන අංශයන් තුළට ප්‍රවාහානුගතකර තිබේද යන්න | C120801 |
| 12.a තවදුරටත් තිරසාරවත් පාරිභෝජන සහ නිෂ්පාදන රටාවන්වලට යොමු වීමට අවශ්‍ය විද්‍යාත්මක සහ තාක්ෂණික ධාරිතාවන් ලබා ගැනීමට සංවර්ධනය වෙමින් පවතින රටවලට සහාය ලබා දීම | 12.a.1 සංවර්ධනය වන රටවල තිරසර පරිභෝජනය සහ නිපැයුම් මෙන්ම පාරිසරිකව හිතකර තාක්ෂණ හා සම්බන්ධ පර් යේෂණ හා සංවර්ධනයන් කෙරෙහි දක්වන සහ සේවයේ ප්‍රමාණය | C120a01 |
| 12.b රැකියාවන් උත්පාදනය කරන්නා වූ සහ දේශීය සංස්කෘතිය සහ භාණ්ඩ ප්‍රවර්ධනය කරන්නා වූ තිරසර සංචාරක කර්මාන්තයකට තිරසර සංවර්ධනය මගින් සිදුකරන්නා වූ බලපෑම අධීක්ෂණය කිරීමට මෙවලම් සංවර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම | 12.b.1 එකඟතාවයට පත් අධීක්ෂණ සහ ඇගයීම් මෙවලම් වලින් සමන්විත තිරසර සංවර් ධන ක්‍ර මෝපායන් හෝ ප්‍රතිපත්ති සහ  ක්‍රියාවට නංවන ලද ප්‍රතිපත්ති සංඛ්‍යාව | C120b01 |
| 12.c ජාතික තත්වයන්ට අනුකූලව බදු අය කිරීම ප්‍රතිව්‍යුහගත කිරීම සහ හානිකර සහනාධාරවලින් ඉවත්වීමද ඇතුළුව වෙළඳපොල මිල විකෘති තත්වයන් ඉවත් කිරීම මගින් අපතේ යන ආකාරයේ පාරිභෝජනය දිරි ගන්වනු ලබන අකාර්යක්ෂම පොසිල ඉන්ධන සහනාධාර නිවැරදි ආකාරයට සැකසීමත් ඒවා මගින් ඇතිවන්නා වූ පරිසර බලපෑම පෙන්වා දීම හා මෙහිදී එම සහනාධාරවලින් ඉවත් වීම මගින් සංවර්ධනය වෙමින් පවත්නා රටවල විශේෂිත අවශ්‍යතාවන්ට හා තත්වයන්ට ඇති වන බලපෑම සැලකිල්ලට ගැනීම සහ මෙමගින් දරිද්‍රතාවෙන් පෙළෙන සහ බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට හා ඔවුන්ගේ සංවර්ධනයට ඇති විය හැකි අහිතකර බලපෑම අවම කිරීම සැලකිල්ලට ගැනීම | 12.c.1 දළ දේශීය නිෂ්පාදන යේ(නිෂ්පාදනය සහ පරිභෝජනය ) ඒකකයක් පොසිල ඉන්ධන සඳහා වෙන් කරන ලද සමස්ත ජාතික පිරිවැයෙන් අනුපාතයක් ලෙස පොසිල ඉන්ධන සහනාධාර ප්‍රමාණය | C120c01 |

**තිරසර සංවර්ධන අරමුණු 13- දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම**

| | | |
|---|---|---|
| 13.1 සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම | 13.1.1 ජනගහනයේ පුද්ගලයන් ලක්ෂයකට හදිසි ආපදා හේතුවෙන් සිදුවන මරණ, අතුරුදහන් වන සහ සෘජුව බලපෑමට ලක්වන පුද්ගලයන් සංඛ්‍යාව | C200303 |
| | 13.1.2 2015-2030 අපදා අවදානම අවම කිරිම සඳහා වන සෙන්ඩායි කාර් ය රාමුවට අනුකූලව ජාතික අවදානම් අවම කිරීමේ ක්‍ර මෝපායන් ක්‍රියාත්මක කරන රටවල් සංඛ්‍යාව | C200304 |
| | 13.1.3 ජාතික අපදා අවම කිරීමේ ක්‍ර මෝපායන්ට සමාන්තරව ප්‍රාෙදේශිය ආපදා අවම කිරීමේ ක්‍ර මෝපායන් යොදාගෙන එය ක්‍රියාවට නංවා ඇති පළාත් පාලන කරන  ආයතන ප්‍රමාණය | C200305 |

| | | |
|---|---|---|
| 13.2 ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායන් සහ සැලසුම්වලට කාලගුණ වෙනස්කම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම | 13.2.1 ආහාර නිෂ්පාදනයට තර්ජනයක් නොවන පරිදි (ජාතික හැඩගැසීමේ සැලැස්මක්, ජාතික අධිෂ්ඨානශීලී දායකත්වය, ජාතික සංන්නිවේදනය සහ අර්ධ වාර්ෂික යාවත්කාලීන වාර්තා සහ සෙසු දේ) දේශගුණික වෙනස්වීමේ අහිතකර බලපෑම් සඳහා හැඩගැසීමට ඔවුන්ගේ හැකියාව වැඩිකරන ඒකාබද්ධ ප්‍රතිපත්ති/ක්‍රමෝපාය/සැලසුම් සහ කාළගුණික වෙනස්වීම් හා හරිතාගාර වායු විමෝචනයන් අවම කිරීම් දියුණු කිරීම සඳහා වන කැපවීම පිළිබඳ අදහස් හුවමාරු කරගෙන, ස්ථාපනය කර සහ ක්‍රියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව | C130201 |
| 13.3 කාලගුණ වෙනස්වීම අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම | 13.3.1 ප්‍රාථමික, ද්විතියික හා තෘතියක අධ්‍යාපන විෂයමාලාවළට අවම කිරීම, හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව දැනුම් දීමේ ක්‍රම ඇතුළත්කර ඇති රටවල් සංඛ්‍යාව | C130301 |
| | 13.3.2 හැඩගැසීම, අවම කිරීම, සහ තාක්ෂණික හුවමාරුව සඳහා වන ආයතනික පද්ධතිමය සහ පුද්ගලයන්ගේ ධාරිතා ගොඩනැංවීම සවිමත් කිරීම හා සංවර්ධනය සඳහා වන ක්‍රියාමාර්ග පිළිබඳ අදහස් සන්නිවේදනය සිදුකරගෙන ඇති රටවල් සංඛ්‍යාව | C130302 |
| 13.a එක්සත් ජාතීන්ගේ කාලගුණික වෙනස් වීම පිළිබඳ ප්‍රඥප්තියට අනුව සංවර්ධනය වෙමින් පවත්නා රටවලට කාලගුණික වෙනස් වීම්වලින් වන බලපෑම අවම කිරීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගැනීමට හා ඒවා විනිවිදභාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීමට හරිත කාලගුණ අරමුදල ඇති කිරීමටත් ඒ සඳහා 2020 වන විට සියලුම මූලාශ්‍රයන්ගෙන් ඒකාබද්ධව වාර්ෂිකව ඩොලර් මිලියන 100ක් එක්රැස් කිරීමේ අරමුණ ලඟා කර ගැනීමටත් හා හැකිතාක් ඉක්මණින් එහි මෙහෙයුම් ආරම්භ කිරීමටත් සංවර්ධනය වූ රටවල් පාර්ශවයේ එකඟතාව ක්‍රියාවට නැංවීම | 13.a.1 ඩොලර් බිලියන 100ක ඉලක්කය සඳහා 2020-2025 කාලය තුළදී වාර්ෂිකව සපයන ලද ඇමෙරිකානු ඩොලර් ප්‍රමාණය | C130a01 |
| 13.b අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ කුඩා දිවයින්වල පිහිටි සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන්, තරුණයින් සහ දේශීය හා ආන්තිකරණයට ලක්වූ ප්‍රජාවන්ද ඉලක්ක කරගනිමින් කාලගුණික වෙනස් වීම් සඳහා ඵලදායී සැලසුම් සකස් කිරීමට හා කළමනාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩිදියුණු කිරීමේ යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම | 13.b.1 කාන්තාවන්, යෞවනයන් සහ ග්‍රාමීය සහ නොසලකා හැරුණු ජන කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් ඵලදායී දේශගුණ විපර්යාස හා සම්බන්ධ සැලසුම් සහ කළමනාකරණ ධාරිතාවයන් ඉහල නැංවීම වෙනුවෙන් වන යාන්ත්‍රණයන් පිණිස මූල්‍ය, තාක්ෂණික හා ධාරිතා සංවර්ධනය ඇතුළු අංශ වෙත සුවිශේෂී සහ ප්‍රමාණවත් සහායක් ලැබෙන ඌන සංවර්ධිත රටවල් සහ සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දූපත් රාජ්‍යයන් සංඛ්‍යාව | C130b01 |
| **තිරසර සංවර්ධන අරමුණු 14- තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය** | | |
| 14.1 2025 වන විට සමුද්‍රීය අපද්‍රව්‍ය සහ පෝෂක දූෂණය වීම ද ඇතුළුව විශේෂයෙන්ම ගොඩබිම් පදනම් කරගත් ක්‍රියාකාරකම් මගින් සිදුවන සියලුම ආකාරයේ සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු මට්ටමින් අවම කිරීම | 14.1.1 වෙරළාසන්න සුපෝෂණ සහ පාවෙන ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඝනත්වය | C140101 |

| | | |
|---|---|---|
| 14.2 2020 වන විට ආපදාවන්ට ඔරොත්තු දීමට සවිබල ගන්වමින් සහ සෞඛ්‍යවත් සහ ඵලදායිතාවෙන් යුක්ත වන ආකාරයට සාගර යථා තත්වයට පත් කරමින් සමුද්‍රීය සහ වෙරළබඩ පරිසර පද්ධති තිරසාර අන්දමින් කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම | 14.2.1 පරිසර පද්ධති පාදක ප්‍රවේශය භාවිතයෙන් කළමනාකරණය කෙරෙන විශේෂ ආර්ථික කලාප ප්‍රමාණය | C140201 |
| 14.3 සියලුම මට්ටමේ විද්‍යාත්මක සහයෝගීතාවන්ගෙන් යුක්තව සාගර ආම්ලීකරණය වීම මගින් ඇතිවන බලපෑම අවම කිරීම සහ එයට විසඳුම් සෙවීම | 14.3.1 අනුමත නියැදි සාම්පල මධ්‍යස්ථානයන්හි මිනුම් කරන ලද සාමාන්‍ය සමුද්‍රිය ආම්ලිකතාවය (PH) | C140301 |
| 14.4 2020 වන විට මසුන්ගේ ජීව විද්‍යාත්මක ගති ලක්ෂණ අනුව තීරණය වී ඇති ආකාරයට තිරසර වශයෙන් උපරිම අස්වැන්නක් ලබා දිය හැකි ආකාරයට මත්ස්‍ය සම්පත් හැකි කෙටිම කාලයකදී නැවත යථා තත්වයට පත් කිරීම සඳහා කාර්යක්ෂම ලෙස මසුන් ඇලිලීම පාලනය කිරීම සහ අසීමිතව, නීතිවිරෝධී, වාර්තා නොකළ සහ පාලනය නොකළ හා හානිකර මසුන් මැරීමේ ක්‍රම භාවිතය අවසන් කිරීම සහ විද්‍යාත්මක පදනමකින් යුක්ත කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම | 14.4.1 ජෛව විද්‍යාත්මක තිරසර මට්ටම් තුළ පවත්නා මත්ස්‍ය තොග ප්‍රමාණය | C140401 |
| 14.5 2020 වන විට හොඳම විද්‍යාත්මක තොරතුරු සහ ජාතික සහ අන්තර්ජාතික නීති වලට අනුකූලව වෙරළබඩ සහ සමුද්‍රීය ප්‍රදෙශවලින් 10% ක් සංරක්ෂණය කිරීම | 14.5.1 සමුද්‍රීය ප්‍රදේශයට සාපේක්ෂව ආරක්ෂිත ප්‍රදේශයන්හි ව්‍යාප්තිය | C140501 |
| 14.6 2020 වන විට පවත්නා ධාරිතාවට වැඩි සහ අධික ලෙස මසුන් මැරීමට හේතුවන විශේෂිත ධීවර සහනාධාර තහනම් කිරීම, නීති විරෝධී, වාර්තා නොවන, පාලනය නොකළ ධීවර කර්මාන්තයට ඉඩ සලසන සහනාධාර ඉවත් කිරීම, සංවර්ධනය වෙමින් පවතින රටවලට සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවලට සුදුසු අන්දමින් ඵලදායී ලෙස විශේෂ කොට සහ වෙනස් අන්දමින් සැලකීමේ වැදගත්කම හඳුනා ගනිමින් ලෝක වෙළඳ සංවිධානයේ ධීවර සහනාධාර සාකච්ඡාවලදී ඒවා අත්‍යවශ්‍ය අංගයක් බවට පත් කිරීම | 14.6.1 රටවල් අනුව නීති විරෝධී වාර්තා නොවූ සහ නියාමනය නොකළ මසුන් ඇලිලීම මැඩලීම ඉලක්ක කරගත් ජාත්‍යන්තර ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීමේ මට්ටම පිළිබඳ ප්‍රගතිය | C140601 |
| 14.7 2030 වන විට තිරසර ලෙස ධීවර සම්පත්, ජලය ආශ්‍රිත සංස්කෘතිය සහ සංචාරක කර්මාන්තය කළමනාකරණය හා තිරසර අන්දමින් සමුද්‍රීය සම්පත් භාවිතා කරමින් සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යවලට සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවලට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ වර්ධනය කිරීම | 14.7.1 සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දූපත් රාජ්‍යයන්, ඌන සංවර්ධිත රටවල් සහ සියලු රටවල් වල දළ දේශීය නිෂ්පාදනයේ පංගුවක් ලෙස තිරසර ධීවර කර්මාන්තය | C140701 |

| | | |
|---|---|---|
| 14.a සාගර සෞඛ්‍ය තත්වය වර්ධනය කිරීම සහ විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යවලට සහ අවම වශයෙන් සංවර්ධනය වූ රටවලට සමුද්‍රීය ජෛව විවිධත්වයේ දායකත්වය වැඩිදියුණු කිරීම සඳහා අන්තර් රාජ්‍ය සාගරවිද්‍යාත්මක කොමිසමේ ක්‍රිපටිපාටීන් සහ සමුද්‍රීය තාක්ෂණය පරිණාමය කිරීමේ මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් විද්‍යාත්මක දැනුම වර්ධනය කිරීම, පර්යේෂණ ධාරිතාවන් සංවර්ධනය කිරීම සහ සමුද්‍රීය තාක්ෂණය හුවමාරු කිරීම | 14.a.1 සමුද්‍රීය තාක්ෂණ ක්ෂේත්‍රය තුළ සිදු කෙරෙන පර්යේෂණ වෙනුවෙන් වෙන්කරන ලද සමස්ත පර්යේෂණ අයවැයෙහි පංගුව | C140a01 |
| 14.b කුඩා පරිමාණ පාරම්පරික ධීවරයින්ට සමුද්‍රීය සම්පත් සහ වෙළඳපොළවලට පිවිසීමට අවස්ථාව ලබා දීම | 14.b.1 රටවල් අනුව කුඩා පරිමාණ ධීවර කර්මාන්තය වෙනුවෙන් ඇති ප්‍රවේශ අයිතිය පිළිගන්නා සහ ආරක්ෂා කරන නෛතික/නියාමන/ප්‍රතිපත්තිමය/ආයතනික කාර්ය රාමුවක් භාවිතයට ගැනීමේ | C140b01 |
| 14.c "අපට අවශ්‍ය අනාගතය (The Future We Want)" හි 158 වන ඡේදයේ සඳහන් කර ඇති පරිදි, සමුද්‍ර සහ ඒවායේ සම්පත් සංරක්ෂණයට සහ තිරසාර අන්දමින් භාවිතා කිරීමට නීතිමය වැඩසැලැස්මක් සපයන්නා වූ UNCLOS හි දැක්වෙන නීති අනුව සමුද්‍ර සහ ඒවායේ සම්පත් සංරක්ෂණය කිරීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම වැඩි දියුණු කිරීම | 14.c.1 සමුද්‍ර සහ ඒවායේ සම්පත් සංරක්ෂණය හා තිරසර භාවිතය සඳහා වන සාමුද්‍රීය නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය මඟින් දැක්වෙන නෛතික ප්‍රතිපත්තිමය සහ ආයතනික කාර්යරාමු, ජාත්‍යන්තර නීතිය ක්‍රියාවට නංවන සමුද්‍රීය ක්ෂේත්‍රය සම්බන්ධව ක්‍රමෝපායන්ට එකඟතාවය පළකිරීමේ ප්‍රගතියක් දක්වා ඇති රටවල් සංඛ්‍යාව | C140c01 |

**තිරසර සංවර්ධන අරමුණු 15- භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම**

| | | |
|---|---|---|
| 15.1 2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන්, විශේෂ වනාන්තර, කඳු සහ වියළි බිම් අන්තර් ජාතික ගිවිසුම්වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගාසිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම | 15.1.1 වන ආවරණය සමස්ත භූමි ප්‍රදේශයේ පංගුවක් ලෙස | C150101 |
| | 15.1.2 ආරක්ෂිත ප්‍රදේශ හා පරිසර පද්ධති ආකාරය අනුව භෞතික හා මිරිදිය ජෛව විවිධත්වය සඳහා වන වැදගත් ස්ථාන ප්‍රමාණය | C150102 |
| 15.2 2020 වන විට සියලුම වර්ගවල වනාන්තර තරසර අන්දමින් කළමනාරණය කිරීම ප්‍රවර්ධනය, වන විනාශය නැවැත්වීම, විනාශ වූ වනාන්තර යථා තත්වයට පත්කිරීම සහ ජගත් මට්ටමින් වන රෝපණය සහ නැවත වන වගාව වර්ධනය කිරීම | 15.2.1 තිරසර වනාන්තර කළමනාකරණය සම්බන්ධයෙන් වන ප්‍රගතිය | C150201 |
| 15.3 2030 වන විට කාන්තාරකරණය තුරන් කිරීම, කාන්තාරකරණය, නියඟය සහ ගංවතුර නිසා බලපෑමට ලක්වූ ඉඩම් ද ඇතුළුව විනාශයට පත් වූ ඉඩම් සහ පස නැවත යථා තත්වයට පත්කිරීම සහ ඉඩම් විනාශයට පත් නොවන ලෝකයක් ඇති කරගැනීම | 15.3.1 සමස්ත භූමි ප්‍රමාණයෙන් නායනයට ලක්ව ඇති ප්‍රමාණය | C150301 |
| 15.4 2030 වන විට තිරසර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය ප්‍රතිලාභ ගෙන දීමට ඒවායේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා ජෛව විවිධත්වය ද සමඟින් කඳුකර පරිසර | 15.4.1 කඳුකර ජෛව විවිධත්වය සම්බන්ධයෙන් වැදගත් ආරක්ෂිත ප්‍රදේශයන්හි ව්‍යාප්තිය | C150401 |

| | | |
|---|---|---|
| පද්ධති සංරක්ෂණය කිරීම තහවුරු කිරීම | 15.4.2 කඳුකර හරිත ආවරණ දර්ශකය | C150402 |
| 15.5 ස්වභාවික වාසභූමි විනාශ වීම අවම කිරීමට කඩිනම් සහ කැපී පෙනෙන ක්‍රියාමාර්ග ගැනීම, ජෛව විවිධත්වයට හානි වීම නැවැත්වීම සහ 2020 වන විට තර්ජනයට ලක් වූ ජීවී විශේෂයන් ආරක්ෂා කිරීම සහ වඳවීයාම වැළැක්වීම | 15.5.1 Red List Index | C150501 |
| 15.6 ජාන සම්පත් උපයෝගී කරගැනීමෙන් ලබන්නා වූ ප්‍රතිලාභ සාධාරණ සහ සමාන අයුරින් බෙදාගැනීම ප්‍රවර්ධනය කිරීම සහ අන්තර්ජාතිකව එකඟ වී ඇති ආකාරයට සුදුසු අන්දමින් එවැනි සම්පත් සඳහා ප්‍රවේශ වීමට අවස්ථාවන් ලබාදීම ප්‍රවර්ධනය කිරීම | 15.6.1 ප්‍රතිලාභයන් සාධාරණ හා සමාන ලෙස බෙදා ගැනීම තහවුරු කිරීම සඳහා නීති සම්පාදක, පරිපාලන හා ප්‍රතිපත්තිමය කාර්ය රාමු ක්‍රියාත්මක කරන රටවල් සංඛ්‍යාව | C150601 |
| 15.7 සංරක්ෂිත සත්ව සහ ශාක විශේෂයන් නීති විරෝධී ලෙස ගෙනයාම හා සොරකම් කිරීම සහ නීති විරෝධී වන සත්ව නිෂ්පාදනයන් සම්බන්ධයෙන් පවතින ඉල්ලුම සහ සැපයුම වැළැක්වීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම | 15.7.1 අලෙවි කෙරෙන වනජීවීන් අතරින් දඩයම් කර නැතහොත් නීති විරෝධී ලෙස ප්‍රවාහනය කෙරෙන ප්‍රමාණය | C200206 |
| 15.8 2020 වන විට ගොඩබිම සහ ජලයේ පරිසර පද්ධතිවල වෙසෙන ආක්‍රමණික පිටස්තර ජීව විශේෂයන් අලුතින් හඳුන්වාදීම සහ ඔවුන්ගෙන් සිදු වන බලපෑම කැපීපෙනෙන ලෙස අඩුකිරීමට ක්‍රියාමාර්ග හඳුන්වා දීම සහ මෙම විශේෂයන් පාලනය හෝ තුරන්කිරීම | 15.8.1 ආක්‍රමණශීලි විදේශීය විශේෂ ව්‍යාප්තිය වැලැක්වීම හා පාලනය කිරීම පිණිස අදාළ වන ජාතික නීති සම්පාදක සහ ප්‍රමාණවත් සම්පත් යොදවා ඇති රටවල් ප්‍රමාණය | C150801 |
| 15.9 2020 වන විට ජාතික සහ ප්‍රාදේශීය සැලසුම්වලට, සංවර්ධන ක්‍රියාවලියට, දරිද්‍රතාව පිටුදැකීමේ ක්‍රමෝපායන්ට සහ ගිණුම්වලට පරිසර පද්ධති සහ ජීව විවිධත්වයේ වටිනාකම ඒකාබද්ධ කිරීම | 15.9.1 2011-2020 ජෛව විවිධත්ව ක්‍රමෝපායික සැලැස්මේ අනිසි ජෛව විවිධත්ව ඉලක්ක අංක 2 (Aichi Biodiversity Target 2) අනුව ස්ථාපිත ජාතික ඉලක්ක සම්බන්ධයෙන් වන ප්‍රගතිය | C150901 |
| 15.a ජීව විවිධත්වයන් සහ පරිසර පද්ධති සංරක්ෂණය කිරීමට සහ තිරසර අන්දමින් භාවිතා කිරීමට සියලුම මූලාශ්‍රයන්ගෙන් මූල්‍ය ප්‍රතිපාදන රැස්කිරීමට උනන්දු කිරීම සහ කැපී පෙනෙන ලෙස වැඩිකිරීම | 15.a.1 ජෛව විවිධත්වය සහ පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරසර භාවිතය සඳහා වන නිළ සංවර්ධන ආධාර සහ රාජ්‍ය වියදම් | C200207 |
| 15.b තිරසර ලෙස වනාන්තර කළමනාකරණය සඳහා සියලුම මූලාශ්‍රවලින් සියලුම මට්ටම්වලට කැපී පෙනෙන ලෙස සම්පත් ලබා දීම සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවලට වන සංරක්ෂණය සහ නැවත වන වගා කිරීම ඇතුළත්ව කළමනාකරණ කටයුතු සඳහා ප්‍රමාණවත් දිරිගැන්වීම් ලබා දීම | 15.b.1 ජෛව විවිධත්වය සහ පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරසර භාවිතය සඳහා වන නිළ සංවර්ධන ආධාර සහ රාජ්‍ය වියදම් | C200207 |
| 15.c තිරසර ජීවනෝපාය මාර්ග අවස්ථාවන් ග්‍රහණය කරගැනීමට දේශීය ප්‍රජාවන්ගේ ධාරිතාව ඉහළ නැංවීමද ඇතුළත්ව සංරක්ෂණය කරන ලද ජීව විශේෂයන් සොරකම් කිරීම සහ කුට්ටනය වැළැක්වීම සඳහා වූ ප්‍රයත්නයන්ට ජගත් මට්ටමේ සහාය ලබා දීම ඉහළ නැංවීම | 15.c.1 අලෙවි කෙරෙන වනජීවීන් අතරින් දඩයම් කර නැතහොත් නීති විරෝධී ලෙස ප්‍රවාහනය කෙරෙන ප්‍රමාණය | C200206 |

**තිරසර සංවර්ධන අරමුණු 16- තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සැම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම**

| | | |
|---|---|---|
| 16.1 සියලුම ස්ථානයන්හි සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් සහ ඒ ආශ්‍රිත මරණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම | 16.1.1 ස්ත්‍රී පුරුෂ භාවය හා වයස අනුව ජනගහනයන් පුද්ගලයන් 10000ක්ම සියදිවි නසා ගැනීම් වලට ලක්වන සංඛ්‍යාව | C160101 |
| | 16.1.2 ස්ත්‍රී පුරුෂ භාවය හා වයස අනුව ජනගහනයන් පුද්ගලයන් ලක්ෂයකට ගැටුම් හා සම්බන්ධ හේතු නිසා සිදුවන මරණ සංඛ්‍යාව | C160102 |
| | 16.1.3 පසුගිය මාස 12 තුළදී කායික, මානසික හෝ ලිංගික හිංසනයට ගොදුරු වූ ජනගහනයේ ප්‍රමාණය | C160103 |
| | 16.1.4 තමන් ජීවත් වන ප්‍රදේශයේ හුදෙකලාව ගමන්බිමන් යාම ආරක්ෂාකාරී ලෙස සිතන ජනගහනයේ ප්‍රමාණය | C160104 |
| 16.2 ළමුන් කෘර වධහිංසා කිරීම්වලට සහ අපයෝජනයට, සූරාකෑමට, කුට්ටනයට සහ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට ලක් වීම අවසන් කිරීම | 16.2.1 පසුගිය මාසයක කාල සීමාව තුළදී සිටි රැකවලුන් අතින් කායික දඬුවම්/හෝ මානසික ප්‍රචන්ඩත්වයන් අත්විඳීමට සිදු වූ වයස අවු 1-17දක්වා ළමුන්ගේ ප්‍රමාණය | C160201 |
| | 16.2.2 ස්ත්‍රී පුරුෂ භාවය හා වයස සහ උපයෝජනයේ ස්වරූපය අනුව ජනගහනයේ පුද්ගලයන් 100000ක් අතරින් මිනිස් ජාවාරමෙහි ගොදුරු බවට පත්වූ පුද්ගලයන් සංඛ්‍යාව | C160202 |
| | 16.2.3 වයස අවු 18 වන විට ලිංගික හිංසනය අත්විඳ ඇති වයස අවු 18-29 වයස් කාණ්ඩයේ තරුණ කාන්තාවන් සහ පිරිමින්ගේ ප්‍රමාණය | C160203 |
| 16.3 සියලුම දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි වීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම | 16.3.1 පසුගිය මාස 12ක කාලය තුළ හිංසනයන්ට ලක් වූ අය අතරින් නිසි බලධාරීන්ගේ නිළ වශයෙන් පිළිගත් ගැටුම් සමථකරන යාන්ත්‍රණයන් වෙත වාර්තා කරන ලද හිංසනයට ලක් වූ පුද්ගලයන් ප්‍රමාණයන් | C160301 |
| | 16.3.2 සමස්ථ සිරකරුවන් සංඛ්‍යාවෙන් දඬුවම් නියම නොකළ රැඳවියන් ප්‍රමාණය | C160302 |
| 16.4 2030 වන විට නීති විරෝධී මූල්‍ය සහ ආයුධ ප්‍රවාහයන් කැපී පෙනෙන ලෙස අඩු කිරීම, සොරකම් කරන ලද වත්කම් නැවත ලබාගැනීම ශක්තිමත් කිරීම සහ සියලුම ආකාරයේ සංවිධානාත්මක අපරාධ තුරන් කිරීම | 16.4.1 අභ්‍යන්තර හා බාහිර නීති විරෝධී මුදල් ගණනේ සමස්ත අගය (ඇමෙරිකානු ඩොලර් අගයෙන්) | C160401 |
| | 16.4.2 ජාත්‍යන්තර ක්‍රමෝපායන්ට සමාන්තරව නිසි බලයලත් නිලධාරියෙකු විසින් හඳුනාගත් හෝ තහවුරුකරගත් අල්ලාගන්නා ලද, සොයාගන්නා ලද හෝ බාර දෙන ලද නීති විරෝධී සමානමයක් සහිත ආයුධ ප්‍රමාණය | C160402 |
| 16.5 සියලුම ආකාරයේ අල්ලස සහ දූෂණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම | 16.5.1 පසුගිය මාස 12 ක කාලය තුළ රාජ්‍ය නිලධාරියෙකුට අල්ලස් ලබා දෙන ලද හෝ රජයේ නිලධාරියෙකු විසින් අල්ලසක් ඉල්ලා සිටි අවස්ථා පිළිබඳ අත්දැකීමකට මුහුණ පාන ලද පුද්ගලයන්ගේ ප්‍රමාණය | C160501 |
| | 16.5.2 පසුගිය මාස 12 ක කාලය තුළදී රාජ්‍ය නිලධාරියෙකු හට අල්ලස් ලබා දුන් හෝ රජයේ නිලධාරියෙකු අල්ලසක් ඉල්ලා සිටින අවස්ථා පිළිබඳ අත්විඳීමට මුහුණදුන් ව්‍යාපාර පුමාණය | C160502 |

| | | |
|---|---|---|
| 16.6 සියලුම මට්ටම්වලදී ඵලදායී වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම | 16.6.1 ප්‍රධාන රාජ්‍ය වියදම් අංශයන් අනුව ( නැතහොත් අයවැය කේතයන් හෝ සමාන ) මූලික අනුමත අයවැයෙන් පංගුවක් ලෙස | C160601 |
| | 16.6.2 සිය අවසන් රාජ්‍ය සේවා අත්දැකීම සම්බන්ධයෙන් තෘප්තිමත් ජනගහනයේ ප්‍රමාණය | C160602 |
| 16.7 සියලුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක, සියලුදෙනා අන්තර්ගත වූ, සහභාගිත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවැතීම තහවුරු කිරීම | 16.7.1 ජාතික ව්‍යාප්තියට සාපේක්ෂව රාජ්‍ය ආයතනයන්හි (ජාතික හා ප්‍රාදේශීය නීති සම්පාදනය ආයතන, රාජ්‍ය සේවා සහ අධිකරණමය) තනතුරු ප්‍රමාණය (ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ආබාධිත පුද්ගලයන් සහ ජන කණ්ඩායම් අනුව) | C160701 |
| | 16.7.2 ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ආබාධ සහිත බව හා ජන කණ්ඩායම් අනුව තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ තමන්ද අන්තර්ගත බවට සහ තම අදහස් වලට ප්‍රතිචාර දක්වන බවට විශ්වාසයක් සහිත ජනගහනයේ ප්‍රමාණය | C160702 |
| 16.8 ජගත් මට්ටමේ පාලන අයතනයන්හි දියුණු වෙමින් පවත්නා රටවල සහභාගිත්වය වඩාත් ශක්තිමත් කිරීම | 16.8.1 සංවර්ධනය වෙමින් පවතින රටවල ජාත්‍යන්තර සංවිධානවල සිටින සාමාජිකයන් හා ඡන්ද අයිතිය සහිත පුද්ගලයන්ගේ ප්‍රමාණය | C200205 |
| 16.9 උපත් ලියාපදිංචි කිරීම ද ඇතුළුව 2030 වන විට සියලු දෙනාටම නීතිමය අනන්‍යතාවක් ලබා දීම | 16.9.1 වයස අනුව, රජයේ බලයලත් ආයතනයක් තුළ තම උපත ලියාපදිංචි කර ඇති වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගේ ප්‍රමාණය | C160901 |
| 16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම | 16.10.1 පසුගිය මාස 12 තුළ මාධ්‍ය වේදීන්, වෘත්තීය සමිති ක්‍රියාකාරීන් සහ මානව හිමිකම් ක්‍රියාකාරීන් මරා දැමීම්, පැහැර ගැනීම්, අතුරුදන් කෙරීම්, රඳවා තබා ගැනීම් සහ වධ හිංසා පැමිණීම් හා සම්බන්ධව පැහැදිලිව හඳුනා ගන්නා ලද අවස්ථා සංඛ්‍යාව | C161001 |
| | 16.10.2 තොරතුරු දැනගැනීම සඳහා වන මහජන ප්‍රවේශය පිණිස වන ව්‍යවස්ථාමය, ආයතනික සහ/හෝ ප්‍රතිපත්තිමය තහවුරු කිරීම් සකස්කර සහ ක්‍රියාවට නංවා ඇති රටවල් සංඛ්‍යාව | C161002 |
| 16.a අන්තර්ජාතික සහයෝගීතාවද ලබාගෙන ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ත්‍රස්තවාදය සහ අපරාධ තුරන් කිරීම සඳහා විශේෂයෙන්ම දියුණු වෙමින් පවත්නා රටවල් ද ඇතුළුව සියලුම මට්ටම්වල අදාළ ජාතික ආයතනවල ධාරිතාවන් ශක්තිමත් කිරීම | 16.a.1 පැරිස් මූලධර්මය හා අනුකූලව ස්වාධීන ජාතික මානව හිමිකම් ආයනයන්හි පැවැත්ම | C160a01 |
| 16.b තිරසර සංවර්ධනය සඳහා වෙනස්කොට සැලකීම වැළැක්වීම සඳහා වූ නීති සහ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම හා බලගැන්වීම | 16.b.1 පසුගිය මාස 12 ක කාලය තුළදී, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය මඟින් තහනම් කර ඇති වෙනස් කොට සැලකීම් වලට අදාළ වෙනස් කොට සැලකීම් හෝ හිංසනයන් තමන් අත් විඳි බවට හැඟෙන බව වාර්තා කරන ජනගහනයේ ප්‍රමාණය | C200204 |

**Goal 17. Strengthen the means of implementation and revitalize the Global Partnership for Sustainable Development**

**මූල්‍ය**

| | | |
|---|---|---|
| 17.1 බදු සහ වෙනත් ආදායම් එක්රැස් කිරීම් වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර්ජාතික සහයෝගය ලබා දීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය | 17.1.1 මූලාශ්‍රය අනුව දළ දේශීය නිෂ්පාදනයෙන් පංගුවක් ලෙස සමස්ත රාජ්‍ය ආදායම | C170101 |
| | 17.1.2 දේශීය අයවැයෙන් දේශීය බදු ආදායමෙහි පංගුව | C170102 |
| 17.2 සංවර්ධිත රටවල් තම දළ ජාතික ආදායමෙන් 0.7% ක ප්‍රතිශතයක් නිල සංවර්ධන ආධාර ලෙස සංවර්ධනය වෙමින් පවත්නා රටවල්වලට ලබාදීමේ හා සංවර්ධිත රටවල දළ ජාතික ආදායමෙන්0.15% සහ0.20% අතර ප්‍රමාණයක් නිල සංවර්ධන ආධාර ලෙස අවම වශයෙන් සංවර්ධනය වූ රටවලට ලබාදීමට සංවර්ධිත රටවල් විසින් වී කිබෙන පොරොන්දුව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සහ අඩුම සංවර්ධිත රටවලට ලබාදෙන නිල සංවර්ධන ආධාර දළ ජාතික ආදායමෙන් 20% ක් දක්වා නැංවීම | 17.2.1 ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය (OECD) සංවර්ධන සහාය කමිටු දායකයන්ගේ දළ ජාතික ආදායම (GNI), හි පංගුවක් ලෙස ඌන සංවර්ධිත රටවල් සඳහා ශුද්ධ නිළ සංවර්ධන ආධාර ප්‍රමාණය | C170201 |
| 17.3 විවිධ මූලාශ්‍ර මඟින් සංවර්ධනය වෙමින් පවත්නා රටවල්වලට අතිරේක මූල්‍ය සම්පත් සජීවීකරණය | 17.3.1 සමස්ත දේශීය අයවැයෙන් පංගුවක් ලෙස සෘජු විදෙස් ආයෝජන (FDI), නිල සංවර්ධන ආධාර සහ දකුණු - දකුණු සහයෝගය | C170301 |
| | 17.3.2 සමස්ත දළ දේශීය නිෂ්පාදනයේ පංගුවක් ලෙස | C170302 |
| 17.4 මූල්‍ය ණය, ණය සහනාධාර සහ ණය ප්‍රතිව්‍යුහගතකරණය ඉලක්ක කර ගත් සම්බන්ධීකරණය කරණ ලද ප්‍රතිපත්ති මඟින් සංවර්ධනය වෙමින් පවත්නා රටවල්වලට දිගු කාලීන ණය ස්ථාවරභාවය සඳහා සහය ලබා දීම සහ අතිශයින් ණයගැත්භාවයට පත් වී ඇති දරිද්‍රතාවයෙන් පෙළෙන රටවලට ණය ආතතිකාරී තත්ත්වයෙන් මිදීම සඳහා විසඳුම් ලබා දීම | 17.4.1 භාණ්ඩ සහ සේවා අපනයනයන්හි පංගුවක් ලෙස ණය සේවා | C170401 |
| 17.5 අවම වශයෙන් සංවර්ධනය වන රටවල ආයෝජන ප්‍රවර්ධන කලාප යොදාගැනීම සහ ක්‍රියාත්මක කිරීම | 17.5.1 ඌන සංවර්ධිත රටවල් සඳහා ආයෝජන ප්‍රවර්ධන යොදාගෙන ඇති සහ ක්‍රියාත්මක කරන රටවල් සංඛ්‍යාව | C170501 |
| **තාක්ෂණය** | | |
| 17.6 විද්‍යාව තාක්ෂණය සහ නවෝත්පාදන වෙනුවෙන් උතුරු -දකුණු දකුණු-දකුණු සහ ත්‍රිකෝණාත්මක කලාපීය සහ අන්තර්ජාතික සහයෝගිතාවය ඉහල නැංවීම සහ විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ මට්ටමේ දැනට පවත්නා යාන්ත්‍රණ අතර සහයෝගිතාවය වැඩිදියුණු කිරීමෙන් සහ ජගත් මට්ටමේ තාක්ෂණ පහසුකම් සැලසීමේ යාන්ත්‍රණයක් මඟින් එකිනෙකා සමග එකඟ වූ කොන්දේසි අනුව දැනුම බෙදාහදා ගැනීම ඉහල නැංවීම | 17.6.1 සහයෝගීතාවයේ ආකාරය අනුව, රාජ්‍යයන් අතර ඇති විද්‍යා සහ / හෝ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම් සංඛ්‍යාව | C170601 |
| | 17.6.2 වේගය අනුව පුද්ගලයන් සියයකට | C170602 |
| 17.7 එකිනෙකා සමඟින් සාකච්ඡාවෙන් ඇතිකරගත් එකඟතාවයන් අනුව වරණීය සහ සහනදායි වාසිදායි කොන්දේසි අනුව පරිසර හිතකාමි තාක්ෂණයන් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වෙනුවෙන් සංවර්ධනය කිරීම | 17.7.1 පරිසර හිතකාමී තාක්ෂණයන් සංවර්ධනය, හුවමාරුව, ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය වෙනුවෙන් සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සඳහා අනුමත මූල්‍යාධාර ප්‍රමාණ සමස්තය | C170701 |

| | | |
|---|---|---|
| 17.8 2017 වන විට අවම වශයෙන් සංවර්ධය වී ඇති රටවල් සඳහා තාක්ෂණ බැංකු හා විද්‍යාව තාක්ෂණය හා නවෝත්පාදන ධාරිතාවන් ගොඩනැංවීමේ යාන්ත්‍රණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ විශේෂයෙන් තොරතුරු තාක්ෂණ හා සන්න්වේදන තාක්ෂණයන්හි නව තාක්ෂණය භාවිතා කිරීම වැඩිදියුණු කිරීම | 17.8.1 අන්තර්ජාලය භාවිතයට ගන්නා පුද්ගලයන් ප්‍රමාණය | C170801 |
| **ධාරිතාවන් ගොඩනැංවීම** | | |
| 17.9 උතුරු -දකුණු  දකුණු- දකුණු ත්‍රිකෝණාත්මක සහයෝගිතාවය හරහා සංවර්ධනය වෙමින් පවතින රටවලට තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීමට ජාතික සැලසුම් සැකසීම සහ ඵලදායී ධාරිතා සංවර්ධනය සඳහා ලබා දෙන අන්තර්ජාතික සහයෝගීතාව වැඩිදියුණු කිරීම | 17.9.1 සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වෙනුවෙන් වෙන්කරන ලද මූල්‍ය හා තාක්ෂණික ආධාරයන්හි (උතුරු-දකුණු, දකුණු-දකුණු සහ ත්‍රෛපාර්ශවීය සහයෝගය ඇතුළුව) ඩොලර් අගය | C170901 |
| **වෙළඳාම** | | |
| 17.10 දෝහා සංවර්ධනය න්‍යාය පත්‍රයේ සාකච්ඡාවල නිගමනයන්ද ඇතුළත්ව විශ්වීය, නීති පදනම් කර ගත්, විවෘත, වෙනස්කොට සැලකිලි නොදක්වන සහ සමානත්වෙන් යුත් බහු පාර්ශවික වෙළඳ ක්‍රමයක් ලෝක වෙළඳ සංවිධනය යටතේ ප්‍රවර්ධනය කිරීම | 17.10.1 ලෝක ව්‍යාප්ත භාරිත තීරුබදු - සාමාන්‍ය අගය | C171001 |
| 17.11 අවම වශයෙන් සංවර්ධනය වූ රටවලින් ලෝක අපනයනයට සපයන කොටස 2020 වන විට දෙගුණ කිරීමේ දැක්මකින් යුක්තව, සංවර්ධනය වෙමින් පවත්නා රටවල අපනයන සැලකිය යුතු මට්ටමකින් වර්ධනය කිරීම | 17.11.1 ලෝක අපනයනයන්හි සංවර්ධනය වෙමින් පවත්නා සහ ඌන සංවර්ධිත රටවල පංගුව | C171101 |
| 17.12 සංවර්ධනය වූ රටවල් විසින් අවම වශයෙන් සංවර්ධනය වූ රටවලින් සිදුකරන්නා වූ ආනයනයන් සඳහා බල පැවැත්වෙන භාණ්ඩ නිෂ්පාදනය කරන ලද ස්ථානය පිළිබඳ වරණීය නීති විනිවිදභාවයෙන් යුක්ත බව සහ සරල හා වෙළඳපොළට පිවිසීමට දායකත්වය සලසන බව තහවුරු කරන බවට වූ ලෝක වෙළඳ සංවිධානයේ තීරණයන්ට අනුව අවම වශයෙන් සංවර්ධනය වූ රටවලට දිගු කාලීනව පවත්නා ලෙසට බදුවලින් සහ කෝටාවලින් නිදහස්ව වෙළඳපොළට පිවිසීමේ හැකියාව නියමිත වේලාවට ක්‍රියාවට නැංවීම | 17.12.1 සංවර්ධන වෙමින් පවතින රටවල්, ඌන සංවර්ධිත රටවල් සහ සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍යයන් | C171201 |
| **පද්ධතිමය කරුණු** | | |
| *ප්‍රතිපත්ති සහ ආයතනික සංගතභාවය* | | |
| 17.13 ප්‍රතිපත්ති සම්බන්ධීකරණය සහ ප්‍රතිපත්ති සංගතභාවය තුලින් ජගත් සාර්ව ආර්තථික ස්ථාවරත්වය වැඩිදියුණු කිරීම | 17.13.1 සාර්ව ආර්ථික දර්ශක | C171301 |
| 17.14 තිරසාර සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති සංගතභාවය වැඩිදියුණු කිරීම | 17.14.1 තිරසර සංවර්ධනයෙහි ප්‍රතිපත්තිමය බැඳීම් ඉහල නැංවීම පිණිස ක්‍රියාත්මක යාන්ත්‍රණයන් සහිත රටවල් සංඛ්‍යාව | C171401 |

| | | |
|---|---|---|
| 17.15 දරිද්‍රතාව පිටුදැකීමේ සහ තිරසාර සංවර්ධනය ඇති කර ගැනීම සඳහා වන ප්‍රතිපත්ති සැකසීමේදී සෑම රටකටම ප්‍රතිපත්ති ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ඇති අයිතියට සහ නායකත්වයට ගරු කිරීම | 17.15.1 සංවර්ධන සහයෝගය ඇපයුම්කරුවනට අනුව රටට අයත් ප්‍රතිඵල කාර්ය රාමු සහ සැලසුම් මෙවලම් භාවිතයේ මට්ටම | C171501 |
| *විවිධ පාර්ශවයන්ගේ හවුල්කාරීත්වයන්* | | |
| 17.16 විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල්ද ඇතුළුව සියලුම රටවලට තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා විවිධ පාර්ශවයන්ගේ හවුල්කාරීත්වයෙන් දැනුම, පළපුරුද්ද, තාක්ෂණය සහ මූල්‍ය සම්පත් සජීවීකරණය සහ බෙදා ගැනීම ඔස්සේ තිරසර සංවර්ධනය සඳහා වූ ජගත් හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීම | 17.16.1 තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත්කර ගැනීම සඳහා සහාය වන බහු පාර්ශවීය සංවර්ධන ඵලදායිතා අධීක්ෂණ කාර්ය රාමු සම්බන්ධයෙන් ප්‍රගතියක් වාර්තා කරන රටවල් සංඛ්‍යාව | C171601 |
| 17.17 අත්දැකීම් පළපුරුද්ද සහ පාර්ශවකරණයේ ක්‍රමෝපායන් සහ මහජනතාව, රාජ්‍ය-පෞද්ගලික අංශය සහ සිවිල් සංවිධාන හවුල්කාරිත්වයන් දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම | 17.17.1 රාජ්‍ය පෞද්ගලික සහ සිවිල් සමාජයීය සහයෝගීතාවය වෙනුවෙන් වෙන් කෙරෙන ඇමෙරිකානු ඩොලර් ප්‍රමාණය | C171701 |
| *දත්ත, අධීක්ෂණය සහ වගකීම* | | |
| 17.18 2020 වන විට අවම වශයෙන් සංවර්ධනය වූ රටවල්, සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍ය ද ඇතුළුව සංවර්ධනය වෙමින් පවත්නා රටවල උසස් ගුණාත්මක තත්වයේ, නිසි කලට නිකුත් වන, විශ්වාසදායී දත්ත, ආදායම, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ජනවර්ගය, ජාතිකත්වය, සංක්‍රමණික තත්වය, ආබාධිත බව, භූ විද්‍යාත්මක ස්ථානය සහ අදාළ සන්දර්භයන් පදනම් කරගෙන වෙන් වෙන් වශයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය දාරිතාවන් ශක්තිමත් කිරීම | 17.18.1 නිල සංඛ්‍යා ලේඛනයන්හි මූලික මූලධර්මයන්ට අනුකූලව, ඉලක්කයන්ට අදාළව සම්පූර්ණ යෙදියක් සහිතව ජාතික මට්ටමින් සකසා ගන්නා තිරසර සංවර්ධන දර්ශක ප්‍රමාණය | C171801 |
| | 17.18.2 නිළ සංඛ්‍යානමය මූලික මූලධර්මයන්ට අනුකූලව ජාතික සංඛ්‍යානමය නීති සම්පාදනයක් සහිත රටවල් සංඛ්‍යාව | C171802 |
| | 17.18.3 මූල්‍ය සැපයුම මූලාශ්‍රවලට අනුව, සම්පූර්ණ මූල්‍ය සැපයුමක් සහිත සහ ක්‍රියාත්මක තත්වයේ පවත්නා ජාතික සංඛ්‍යානමට සැලැස්මක් සහිත රටවල් සංඛ්‍යාව | C171803 |
| 17.19 2030 වන විට දැනට පවත්නා ක්‍රියාමාර්ග ද උපයෝගී කරගෙන දළ දේශීය නිෂ්පාදනයට අතිරේකව තිරසර සංවර්ධනයේ ප්‍රගතිය මැනීමට මිනුම් සංවර්ධනය කිරීම සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල සංඛ්‍යාන ධාරිතාවන් ගොඩනැංවීමට සහයෝගය ලබා දීම | 17.19.1 සංවර්ධනය වෙමින් පවත්නා රටවල සංඛ්‍යා ලේඛනමය ධාරිතා සංවර්ධනය සඳහා ඇති සම්පත් ප්‍රමාණය ඩොලර් අගයෙන් | C171901 |
| | 17.19.2 (a)පසුගිය වසර 10ක කාලය තුළ දී අඩු කරමින් එක් ජන හා නිවාස සංගණනයක් හෝ පවත්වා (b) 100% ක උපත් ලියාපදිංචි මට්ටමක් සහ 80%ක මරණ ලියාපදිංචි මට්ටමක් ළඟා කරගෙන ඇති රටවල් ප්‍රමාණය | C171902 |

* As contained in the **Annex** of the resolution adopted by the General Assembly on 6 July 2017, **Work of the Statistical Commission pertaining to the 2030 Agenda for Sustainable Development (A/RES/71/313)**

[1] Resolution 68/261.

[†] Indicator codes were developed by UNSD for data transfer, tracking and other statistical purposes.

[2] Acknowledging that the United Nations Framework Convention on Climate Change is the primary international, intergovernmental forum for negotiating the global response to climate change.

[3] Taking into account ongoing World Trade Organization negotiations, the Doha Development Agenda and the Hong Kong ministerial mandate.